# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2347/02 - 2023 අගෝස්තු මස 28 වැනි සඳුදා - 2023.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු 53 වැනි වගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සාදනු ලබන රීති.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2023 අගෝස්තු මස 25 වැනි දින.
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති "2023 අංක 1 දරන ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලසුම් රීති" ලෙස හඳුන්වනු ලැබේ.

2. **ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය සංවිධානය**

2.1 සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන්

2.1.1 ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) සහ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) පහත සඳහන් සම්මුතීන් තුළ ජාත්‍යන්තර වගකීම් දක්වා ඇති අතර, ඒ සඳහා අත්සන් තැබූ රාජ්‍යයන්, සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන් සැපයිය යුතුය:

- ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා පිළිබඳ සම්මුතිය (Chicago Convention), 1944, ඇමුණුම 12 (Annex 12),
- සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS),1994 (අනුමත කිරීමට යටත්ව),
- සමුද්‍රීය ජීවිත ආරක්ෂාව පිළිබඳ (SOLAS) සම්මුතිය, 1974 (අනුමත කිරීමට යටත්ව).

2.1.2 ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයෙ ඉලක්කය වන්නේ ඵලදායී ගෝලීය සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතියක් ස්ථාපනය තුළින්, අහසේ හෝ මුහුදේ ගමන් ගන්නා මිනිසුන්ට අවශ්‍ය වූ විටක අඛණ්ඩව සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සැපයීමයි. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය සහ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය එක්ව සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන් සැපයිය යුතු ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ සහිත අන්තර්ජාතික ගගන නාවික සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් (IAMSAR) අත්පොත ප්‍රකාශයට පත් කර ඇත.

2.1.3 සෙවීම් සහ මුදවා ගැනීම් සේවා යනු, සහයෝගිතා ගුවන්යානා, යාත්‍රා සහ අනෙකුත් අභ්‍යවකාශ යානා සහ ස්ථාපනයන් ඇතුළුව, රාජ්‍ය සහ පෞද්ගලික වත්කම් හෝ සැපයුම් භාවිතය හරහා වෛද්‍ය උපදෙස්, මූලික වෛද්‍ය ආධාර, හෝ මූලික වෛද්‍ය ආධාර හෝ පහසුකම් සහිත ස්ථානයකට යොමු කිරීම ඇතුළු ආපදා නිරීක්ෂණ, සන්නිවේදනය, සම්බන්ධීකරණය සහ සෙවීම් සහ මුදවා ගැනීම් කාර්යයන් ඉටුකිරීම ලෙස අර්ථ දක්වා ඇත.

2.1.4 විපතට පත් පුද්ගලයින්ට සහ සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම්වලින් දිවි ගලවාගත් අයට ආධාර සැපයීමේදී, සාමාජික රටවල් එවැනි පුද්ගලයෙකුගේ ජාතිකත්වය හෝ තරාතිරම හෝ එම පුද්ගලයා හමු වූ තත්වයන් නොසලකා එසේ කළ යුතු වන්නේය.

2.1.5 එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියට (UNCLOS) සහ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා පිළිබඳ චිකාගෝ සම්මුතියට (Chicago Convention) අනුකූලව, ශ්‍රී ලංකාවට අයත් වන දේශ සීමා කලාපයන්, දේශ සීමා මුහුදු කලාපයන් සහ විවෘත මුහුදු කලාප වලින් සැදුම් ලත් සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR) තුළ, ගගන නාවික සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණය සහ සේවා සැපයීමේ වගකීම පැවරෙනු ඇත.

2.2 ජාතික සෙවීම් සහ මුදවා ගැනීම් නීති සම්පාදනය

2.2.1 2.1.1 වගන්තියේ දක්වා ඇති අදාළ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව, එහි සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ විපතට පත් පුද්ගලයින්ට සෙවීම් සහ මුදවා ගැනීම් සැපයීම සහ සම්බන්ධීකරණය කිරීම ඵලදායී ලෙස පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාව බැඳී සිටී. සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා සහය වීමේ වගකීම, නියාමන සහ මෙහෙයුම් මට්ටමින් රාජ්‍ය ආයතන ගණනාවකට පවරා ඇත.

2.2.2 සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් නිකුත් කර ඇති, 1955 ගුවන් සන්තරන රෙගුලාසිවල විධිවිධාන වගන්තිය 11 (1) , (2) සහ (3), 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ II කොටසෙහි 7 (h), 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 31 (c) සහ 54 වගන්ති, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) ඇමුණුම 12 (Annex 12) ට සමගාමීව සකස් කරන ලද සිවිල් ගුවන් සේවා අධිකාරී සම්මතයන් (IS) අංක 29, සහ ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරී සෙවීම් සහ මුදවා ගැනීම් අත්පොත (SLCAP 2700), අන්තර්ජාතික ගගන නාවික හා සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් අත්පොත (IAMSAR) වෙළුම (volume) I, II සහ III, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ආසියා ශාන්තිකර කලාපීය කාර්යාලය මගින් නිකුත් කරන ලද ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මට (ICAO APAC SAR Plan V.3.0/2019) අනුගතව, මෙම ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලසුමට ඇතුළත් ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැපයීමේ කාර්යයන් සහ වගකීම් සඳහා පදනම සකස් කර ඇත.

2.3 ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR)

2.3.1 සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සැපයීම සහ සම්බන්ධීකරණය සඳහා වගකීම් ප්‍රදේශය, එක් එක් රාජ්‍යය සඳහා නම් කරන ලද සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය වේ. මෙය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හා සබැඳි නිශ්චිත මානයන් සහිත ප්‍රදේශයකි.

2.3.2 සෙවීම් සහ මුදවා ගැනීම් සන්නිවේදනය, වෛද්‍ය ආධාර සේවා, කාර්යක්ෂම ආපදා අනතුරු ඇඟවීම් සිදු කිරීම සහ ජාතිකත්වය හෝ තත්වය නොසලකා ආපදාවට ලක්වන ඕනෑම කෙනෙකුට උපකාර කිරීම ඇතුළුව, අදාළ කලාප තුළ ඵලදායී, ප්‍රමාණවත් සහ මූලික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා, සෙවීම් සහ මුදවා ගැනීම් කලාප පිහිටුවා ඇත.

2.3.3 ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR), ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින්, සේවා සහ පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකාවට පවරා ඇති කොළඹ පියාසැරි තොරතුරු කලාපය (FIR) හා සමපාත වේ.

2.3.4 මෙම සැලැස්මේ ඇමුණුම-1 හි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR) ලෙස මෙම ප්‍රදේශය සඳහන් වේ.

2.3.5 ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයේ සීමා, ශ්‍රී ලංකාව සහ එහි අසල්වැසි රාජ්‍යයන් අතර කිසිදු

දේශ සීමා මායිමක සීමා නිර්ණයට සම්බන්ධ නොවන්නේය. සෙවීම් සහ මුදවා ගැනීම් කලාප ස්ථාපිත කර ඇති එකම අරමුණ, සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණය සඳහා පමණි.

2.4 ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් වගකීම්

2.4.1 ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියේ ඇමුණුම 12 ට අනුව, ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ විපතට පත් ගුවන් යානා සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සැපයීමේ වගකීම, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය හරහා, ශ්‍රී ලංකා රජයට පැවරී ඇත. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙනුවෙන්, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීමේ වගකීම, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ (AASL), ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) මගින් ක්‍රියාත්මක කරයි.

2.4.2 සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අනුකූලව, රජය, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය හරහා, ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයෙහි මුහුදේ යාත්‍රාවන්හි සිටින පුද්ගලයින් සඳහා සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සැපයීමේ වගකීම භාර ගෙන ඇත. වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය වෙනුවෙන්, සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම, වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වගකීම වන අතර, එම වගකීම, ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ පවතින සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) මගින් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාවට පවරා ඇත.

2.4.3 සෑම සෙවීම් සහ මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක්ම අනෙකුත් සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානවලට (RCC) අවශ්‍ය වූ විට ආධාර සැපයීමට වග බලා ගත යුතුය.

2.4.4 කිසියම් ගුවන් යානා අනතුරක් හෝ සිදු වීමක් සිදු වූ විට, විමර්ශන පැවැත්වීම සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරියේ වගකීම, ශ්‍රී ලංකාවේ ගුවන් යානා අනතුරු සහ සිද්ධි විමර්ශන රෙගුලාසියෙහි නිශ්චිතව දක්වා ඇත. ඒ අනුව සිවිල් ගුවන් සේවා අධිකාරිය විමර්ශන පැවැත්විය යුතු වන්නේ එම සිදුවීම හෝ අනතුර පහත දැක්වෙන පරිදි සිදු වූ විට ය:

- ශ්‍රී ලංකාවේ දේශ සීමාව ඇතුළත,
- ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති ඕනෑම ගුවන් යානයක් සම්බන්ධයෙන්; හෝ
- අනතුර සිදුවූ රාජ්‍යය හෝ අනතුර සිදු වූ ප්‍රදේශය අයත් වන රාජ්‍යය මගින් පරීක්ෂණයක් නොපවත්වන, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඕනෑම ගුවන් යානයක් සම්බන්ධයෙන්.

2.5 ශ්‍රී ලංකාවේ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම (NASARP):

2.5.1 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීමේ සැලැස්ම යනු, ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් වගකීම් සහිත සියලුම රාජ්‍ය ආයතන මගින් භාවිතා කිරීම සඳහා වන මූලික යොමු ලේඛනයයි. ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීමේ සැලැස්ම මගින් ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් ආයතන, සිය ජාතික සහ ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීම සඳහා සාමූහිකව එක්ව කටයුතු කරන ජාතික විධිවිධාන ගෙනහැර දක්වයි.

2.5.2 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මේ අරමුණු වන්නේ,

- සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සම්බන්ධීකරණය සඳහා සැලැස්මක් සැපයීමටත්, ජාතික අවශ්‍යතා සැපිරීම හා ජාතික ප්‍රතිපත්තිය ලේඛනගත කිරීම ;
- ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකරණය, පවතින වත්කම් හෝ සැපයුම් ඵලදායී ලෙස භාවිතා කිරීම, අන්‍යෝන්‍ය සහය සහ එවැනි සහයෝගීතාව සහ සේවාවන් වැඩිදියුණු කිරීමට දරන උත්සාහයන් සඳහා සමස්ත සැලැස්මක් සැපයීම;
- ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීමේ සිද්ධීන් සඳහා සම්බන්ධීකරණය, කාලෝචිත සහ ඵලදායී ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියා පටිපාටි අවබෝධ කර ගනිමින් ආයතනික සංවිධාන ව්‍යුහය සැපයීම; සහ
- පවතින සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් හෝ සැපයුම් ඒකාබද්ධ කොට, කාර්යක්ෂමව යෙදවීමෙන්, ඉහළ සංඛ්‍යාවකගේ ජීවිත ආරක්ෂාව සහතික කිරීම.

2.5.3 මෙම සැලැස්ම මගින් තවදුරටත් අදහස් කරන්නේ:

- සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධ ආයතනික ව්‍යුහයන් සංවර්ධනය සඳහා ජාතික මාර්ගෝපදේශ සැපයීම;
- ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය තුළ එහි සහභාගිතා ආයතන සහ එම ආයතනවල භූමිකාවන් විස්තර කිරීම;
- ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා ප්‍රමුඛ ජාතික නියෝජිත ආයතන හඳුනා ගැනීම සහ එම ආයතනවල වගකීම් විස්තර කිරීම;
- සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වලින් දිවි ගලවා ගත් අයට මූලික ආධාර සැපයීම සහ ඔවුන් ආරක්ෂිත ස්ථානයකට භාරදීම ඇතුළුව සියලුම මෙහෙයුම් සඳහා කටයුතු කිරීම ; සහ
- සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන්හි සමස්ත සහ අඛණ්ඩ සංවර්ධනය, සම්බන්ධීකරණය සහ වැඩිදියුණු කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

2.5.4 මෙම ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම, අන්තර්ජාතික ගගන නාවික සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් අත්පොතෙහි (IAMSAR Manual) දක්වා ඇති ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශයන්ට හැකිතාක් දුරට අනුගතව සැලසුම් කොට ඇත. වෙනසක් වී ඇත්නම් එසේ වීමේ මූලික අපේක්ෂාව වන්නේ, අවශ්‍ය වූ විට වෙනත් රාජ්‍යයන් සමඟ ඒකාබද්ධ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වලදී සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සැපයීම සඳහා සහභාගී වන සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක සහ පුද්ගලයින්ට ඒකාකාරව සහ ඵලදායී ලෙස ක්‍රියා කිරීමට ඇති හැකියාව සහතික කිරීමයි.

2.5.5 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මේ දක්වා ඇති මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති, ශ්‍රී ලංකාවේ නෛතික ප්‍රතිපාදනවලට හෝ ශ්‍රී ලංකාව විසින් පිළිපදින ජාත්‍යන්තර සම්මුතීන්ට සහ බැඳීම්වලට පටහැනි නොවන්නේය.

2.5.6 මෙම ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීමේ කලාපය තුළ, මුහුදට, වෙනත් ඕනෑම ජල කඳකට හෝ ගොඩබිම් ප්‍රදේශයකට ගුවන් යානයක් කඩා වැටීමේ සිදුවීමක්/ අනතුරක් සම්බන්ධ සිදුවීම් සඳහා අදාළ වේ.

2.6 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම පාලනය කිරීම.

2.6.1 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව (NASC) :

2.6.1.1 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවාගැනීමේ කමිටුව යනු, ශ්‍රී ලංකාවේ සියලුම සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධ පාර්ශවකරුවන් සහ සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධ ගැටළු සඳහා වන විධායක කමිටුවයි. ශ්‍රී ලංකාවේ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සහ එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම තුළින් ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ ඵලදායී සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සහ මෙහෙයුම් සඳහා උපාය මාර්ගික මාර්ගෝපදේශ සැපයීම සඳහා කමිටුව වගකිව යුතුය.

2.6.1.2 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව සඳහා යොමු නියමයන් මෙම සැලැස්මේ 2.6.2 හි දක්වා ඇත.

2.6.1.3 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ නියාමනය, සම්බන්ධීකරණය, ප්‍රතිචාර දැක්වීම සහ විමර්ශනය සඳහා වගකිව යුතු අදාළ අමාත්‍යාංශ, අධිකාරීගත ආයතනවල පහත සඳහන් නිලධාරීන් ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීමේ කමිටුවෙහි සාමාජිකයන් වන්නේය :

1) වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් (සම සභාපති),
2) ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් (සම සභාපති),
3) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්,
4) ධීවර අමාත්‍යාංශයේ ලේකම්,
5) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්,
6) විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්,

7) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් (ලේකම්),

8) ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සභාපති,

9) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්.

2.6.1.4 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මේ මගපෙන්වීම අනුව සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් අත්පොත සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව වගකීම දරයි. මෙමගින් ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයට අනන්‍ය වූ සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සැපයීමේ හැකියාව ඇති, මනාව සම්බන්ධීකරණය කරන ලද, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතියක් පිහිටුවීමට හැකියාව ලැබේ.

2.6.2 ශ්‍රී ලංකාවේ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව සඳහා යොමු නියමයන්

2.6.2.1 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව පිහිටුවීමේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය සඳහා උපාය මාර්ගික සම්බන්ධීකරණය, මග පෙන්වීම සහ නායකත්වය සැපයීමයි. කමිටුව, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකදී හෝ, එවැනි අවස්ථාවක් රහිත වන විට, අවම වශයෙන් වසරකට වරක්වත් රැස්වීම් පැවැත්වීම අනිවාර්ය වේ. ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව විසින් ගන්නා තීරණ, නියමිත සළකා බැලීම සඳහා සිවිල් ගුවන් සේවා විෂයභාර අමාත්‍ය වරයා වෙත වාර්තා කළ යුතු වන්නේය.

2.6.2.2 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුවෙහි (NASC) සම සභාපතිත්වය දරනු ලබන්නේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරන අතර, අනෙකුත් කමිටු සාමාජිකයින්, 2.6.1.3 හි නිශ්චිතව දක්වා ඇති පරිදි සමන්විත විය යුතුය.

2.6.2.3 පහත සඳහන් දෑ ඉටු කිරීම සඳහා කමිටුව වගකිව යුතුය :

a. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කාරණා පරිපාලනය සහ සම්බන්ධීකරණය සඳහා ස්ථාවර ජාතික සංසදයක් ලෙස ක්‍රියා කිරීම;

b. ශ්‍රී ලංකාව සඳහා ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම.

c. ඵලදායී සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර සැලසුම් සඳහා ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් අත්පොත සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම;

d. සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියා පටිපාටි, සහ පුහුණු වීම් ප්‍රමිතිගත කොට, ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් පාර්ශවකාර ආයතන අතර, සෙවීම් සහ මුදවා ගැනීම් අවස්ථාවකදී අවශ්‍ය වන අන්තර් ක්‍රියාකාරීත්වය සක්‍රීය කිරීම;

e. සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සපයන්නන් සතුව, සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා සූදානම් සැලසුම් ඇති බව සහ එම සැලසුම් තුළ සමූහ මුදවා ගැනීම් සැලසුම් අන්තර්ගත වීම සහ ඒ සඳහා අවශ්‍ය වන පුහුණු අභ්‍යාසයන් ඔවුනොවුන් විසින් සිදු කිරීම සහතික කිරීම;

f. සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන්හි කාර්යක්ෂමතාවය සහ සමස්ත ඵලදායී බව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන උපකරණ සහ පද්ධති නඩත්තු කිරීම;

g. ඵලදායී සහ කාර්යක්ෂම සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවක් සැපයීම සඳහා අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ හමුදා බලධාරීන් ඇතුළු අනෙකුත් ආයතන අතර සමීප සහයෝගීතාව සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම;


h. සෙවීම් සහ මුදවා ගැනීම් අධීක්ෂණ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම සඳහා ගුවන්, නාවික සහ දේශීය සෙවීම් සහ මුදවා ගැනීම් ආයතන අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම;

i. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා පවතින සියලුම පහසුකම් ඵලදායී ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම;

j. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන්හි සමස්ත ඵලදායී බව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට විකල්ප ක්‍රියා මාර්ග තීරණය කිරීම;


k. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සහ හදිසි සේවා සපයනු ලබන, කලාපීය සහ ජාත්‍යන්තර සංවිධානවල සහාය ගැනීමේදී/ලැබීමේදී මැදිහත්කාර පාර්ශවයක් ලෙස කටයුතු කිරීම.

2.6.3 සෙවීම් සහ මුදවා ගැනීම් සංවිධාන සටහන




රූපය 1: සෙවීම් සහ මුදවා ගැනීම් සංවිධාන සටහන

2.6.4 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර යාන්ත්‍රණය




රූපය 2: ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර යාන්ත්‍රණය

2.7 සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා පාර්ශ්වකරුවන් වූ ආයතනවල කාර්යභාරයන් සහ වගකීම් මෙම සැලැස්මට අනුගතව සෙවීම් සහ මුදවා ගැනීම් ආයතනවල කාර්යභාරයන් සහ වගකීම් මෙහි දක්වා ඇති අතර එක් එක් සෙවීම් සහ මුදවා ගැනීම් ආයතනය විසින් අනුගමනය කළ යුතු සවිස්තරාත්මක ක්‍රියා පටිපාටිය ඔවුන්ගේ අදාළ මෙහෙයුම් අත්පොත් වල සම්මතයන් සහ ක්‍රියා පටිපාටි ලෙස ඇතුළත් කළ යුතුය.

2.7.1 වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය (Ministry of Ports, Shipping and Aviation)

සිවිල් ගුවන් සේවාවන් යටතේ කාර්යයක් ලෙස සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ වගකීම වේ.

අමාත්‍යාංශය පහත වගකීම් දරනු ලැබේ.

a. රාජ්‍යය වෙනුවෙන් ජාතික ආපදා සැලසුම් සමඟ ඒකාබද්ධ වූ සමූහ මුදවා ගැනීමේ මෙහෙයුම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් ඇතුළත් ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීමේ වගකීම, මෙම ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මේ අර්ථ දක්වා ඇති පරිදි සුදුසු උපායමාර්ගික පාර්ශවකරුවන් වෙත පැවරීම.

b. ශ්‍රී ලංකාවේ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය සඳහා උපාය මාර්ගික සම්බන්ධීකරණය, මග පෙන්වීම සහ නායකත්වය සැපයීම සඳහා සහ අවශ්‍ය පරිදි සෙවීම් සහ මුදවා ගැනීම් කාරණා සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයාට උපදෙස් දීමට සහ රාජ්‍ය ආයතන අතර උපරිම ප්‍රායෝගික සහයෝගීතාව සහතික කිරීම සඳහා ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුවක් පිහිටුවීම.

c. සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය සහ අදාළ මෙහෙයුම් සම්බන්ධව අවශ්‍ය විය හැකි අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණයට අදාළව අවශ්‍ය මඟ පෙන්වීම සහ මැදිහත්වීම් සැපයීම.

d. සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුමකදී භාවිතා කිරීම සඳහා දේශීය ගුවන් යානා ක්‍රියාකරුවන්ගෙන් (local aircraft operators) ඕනෑම ගුවන් යානයක් ඉල්ලා සිටීම සඳහා අමාත්‍යවරයාගේ විධානය පරිදි පහසුකම් සැලසීම.

e. සෙවීම් සහ මුදවා ගැනීම් සේවා බිඳ වැටීමකදී, වෙනත් ආයතනයකට හෝ රාජ්‍යයකට සෙවීම් සහ මුදවා ගැනීම් තාවකාලිකව පැවරීම සඳහා පහසුකම් සහ ක්‍රියාමාර්ග සැලසීම.

f. සෙවීම් සහ මුදවා ගැනීම් සහයෝගිතාව සහ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා අසල්වැසි රාජ්‍යයන් සමඟ ගිවිසුම්වලට එළඹීමට සිවිල් ගුවන් සේවා අධිකාරියට සහාය වීම සහ එමගින් එකිනෙකාගේ සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක වෙත ඔවුනොවුනගේ ප්‍රදේශයට ඇතුළුවීම සඳහා සුදුසු තත්වයන් සලසාදීම.

g. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වල අවශ්‍ය තොරතුරු ජන මාධ්‍ය හරහා ජනතාව වෙත සම්ප්‍රේෂණය සහතික කිරීම.

ශ්‍රී ලංකාවේ වරාය, නාවික සහ ගුවන් සේවා කටයුතු පිළිබඳ වගකීම දරන අමාත්‍යාංශය වශයෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය (වෙනම පාර්ශ්වකරුවෙකු ලෙස අර්ථ දක්වා ඇත, යොමුව 2.7.21), ලංකා නැව් සංස්ථාව සහ වෙළඳ නාවික ලේකම් කාර්යාලය වැනි නියෝජිත ආයතනවල උපකරණ සහ නිපුණතා සහිත පුද්ගලයින් කාලෝචිත ලෙස සංවිධානය කිරීමෙන් සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා ඔවුන්ගේ අවශ්‍ය සේවාවන් සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීමේ වගකීම ද අමාත්‍යාංශය සතු වේ.

සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත, හදිසි අවස්ථාවකදී සියලුම සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරන ආයතනය ලෙස, දැනට පවතින සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය වෙත වෙළඳ නැව් යොමු කිරීමේ බලය පැවරී ඇත.

හදිසි අවස්ථාවකදී සෙවීම් සහ මුදවා ගැනීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ බලය, සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත, ශ්‍රී ලංකා නාවික හමුදාව හරහා වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් පවරා ඇත. ඒ අනුව, සිදු වෙමින් පවතින සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය වෙත වෙළඳ නැව් යොමු කිරීමේ බලය, සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇත.

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකදී, වෙළඳ නාවික ලේකම් කාර්යාලය පහත වගකීම් දරනු ලැබේ ;

a. ශ්‍රී ලංකාවේ සමුද්‍රයේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ සිදුවන ගුවන් අනතුරු පිළිබඳ අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීමට, වාණිජ අරමුණු සඳහා මෙහෙය වන වෙළඳ යාත්‍රා යොමු කිරීම.

b. සමුද්‍රයේ සිදුවන ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා වෙළඳ නැව්වල සහාය ලබා ගැනීම.

c. සමුද්‍රයේ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සිදු කිරීමේදී සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් අවශ්‍ය වෙනත් ඕනෑම සහයෝගයක් ලබා දීම.

d. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමට සම්බන්ධ වෙළඳ නැව්වලට අදාළ රාජ්‍ය වෙත දැනුම්දීම් සහ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමට සම්බන්ධ වෙළඳ නැව් සඳහා අදාළ පරිදි මග පෙන්වීම සහ සහාය ලබාදීම.

### 2.7.2 ආරක්ෂක අමාත්‍යාංශය (Ministry of Defence - MOD)

a. ශ්‍රී ලංකාවේ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය සඳහා උපාය මාර්ගික සම්බන්ධීකරණය, මග පෙන්වීම සහ නායකත්වය සැපයීම සහ ආරක්ෂක අමාත්‍යවරයාට සෙවීම් සහ මුදවා ගැනීම් කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි උපදෙස් දීම සහ ආරක්ෂක අමාත්‍යාංශයෙහි විෂය පථය යටතේ ඇති ආයතන අතර, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධයෙන් උපරිම ප්‍රායෝගික සහයෝගීතාව සහතික කිරීම.

b. විදේශීය ගුවන් යානාවලට, ශ්‍රී ලංකාවට ඇතුළු වීමට සහ ගොඩබෑම සඳහා ආරක්ෂක අවසරය ලබා දීම.

c. සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් හෝ මෙහෙයුමක් අතරතුර අවස්ථාවට අනුව අවශ්‍ය පරිදි විදේශීය සෙවීම් සහ මුදවා ගැනීම් උපකරණ ගෙන ඒමට අවශ්‍ය අවසරය ලබා දීම.

d. විපතටපත් ගුවන් යානාවලට සහ ගුවන්යානා අනතුරකින් දිවි ගලවාගත් අයට උපකාර කිරීම සඳහා, ආරක්ෂක අමාත්‍යාංශයෙහි පරිපාලන පෙර දැක්ම යටතේ ආරක්ෂක හමුදා සහ අනෙකුත් ආයතනවලට අයත් සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක යෙදවීම සඳහා කඩිනම් සම්බන්ධීකරණය සිදු කිරීම.

ආරක්ෂක අමාත්‍යාංශයෙහි විෂය පථය යටතේ පවතින එම ආයතනවල භූමිකාවන් සහ වගකීම් 2.7.6, 2.7.7, 2.7.8, 2.7.9 සහ 2.7.10 හි දක්වා ඇත.

### 2.7.3 ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (Civil Aviation Authority of Sri Lanka - CAASL)

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පනත II වන කොටස 7 (h), අනුව, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මහපෙන්වීම යටතේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් "ගුවන් යානා අනතුරු සහ ඊට අදාළ වෙනත් ඕනෑම සිද්ධීන් සම්බන්ධව විමර්ශන ආරම්භ කිරීම, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් ස්ථාපිත කිරීම සහ සැපයීම සඳහා කටයුතු සංවිධානය කිරීම සහ ගුවන් ගමන් ආරක්ෂණ උපද්‍රව සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය".

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය තවදුරටත් පහත වගකීම් දරනු ලැබේ;

a. ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම සහ අනපේක්ෂිත තත්වයන් සඳහා වූ සැලසුම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට සහාය වීම.

b. විපතට පත් ගුවන් යානාවලට සහ ගුවන් යානා අනතුරුවලින් දිවි ගලවා ගත් අයට උපකාර කිරීම සහතික කිරීම සඳහා ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සේවා ස්ථාපිත කිරීම සහ කඩිනමින් සැපයීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

c. හදිසි තත්වයක සිටින හෝ හදිසි තත්වයකට භාජනය විය හැකි යැයි හැඟෙන ඕනෑම ගුවන් යානයකට හෝ එහි ගුවන් මගීන්ට සහාය වීම සඳහා සෙවීම් සහ මුදවාගැනීම් ඒකක සහ පවතින අනෙකුත් පහසුකම් භාවිතා කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

d. සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධ, අදාළ තොරතුරු සුදුසු ගගන නාවික ප්‍රකාශනවල ප්‍රකාශයට පත් කිරීම.

e. රාජ්‍ය සෙවීම් සහ මුදවා ගැනීම් පහසුකම්, සෙවීම් සහ මුදවා ගැනීම් උපකරණ සහ සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක වල වත්මන්, විස්තීර්ණ ඉලෙක්ට්‍රොනික ලැයිස්තුවක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධීකරණය කිරීම.

f. ශ්‍රී ලංකාවේ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් අවශ්‍යතාවයේ පරිමාණය සහ සංකීර්ණත්වය අනුව, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සපයන්නාගේ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ අධීක්ෂණය කිරීම.

g. ස්ථානීය (on-site) සෙවීම් සහ මුදවා ගැනීම් අධීක්ෂණ ක්‍රියාකාරකම්වල නිරත වීම.

h. සෙවීම් සහ මුදවා ගැනීම් සහයෝගිතාව සහ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා අසල්වැසි රාජ්‍යයන් සමඟ ගිවිසුම්වලට එළඹීම, එකිනෙකාගේ සෙවීම් සහ මුදවා ගැනීමේ ඒකක වෙත ඔවුනොවුනගේ ප්‍රදේශයට ඇතුළුවීම සඳහා සුදුසු තත්වයන් සලසා දීම.

i. සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර අවශ්‍ය වන ගුවන් යානා අනතුරු සහ වෙනත් අදාළ සිදුවීම් පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම.

j. විදේශීය ගුවන් යානා සඳහා සුදුසු ගුවන් තොටුපළවලට ගොඩබෑමට සහ අවශ්‍ය විට සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වලට සම්බන්ධ වීමට අවශ්‍ය අවසරය ලබා දීම.

k. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වල යෙදෙන පුද්ගලයින් / කණ්ඩායම් විසින් වෙනත් රාජ්‍යයන්ගෙන්, අමතර සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් සම්බන්ධව කළ හැකි ඉල්ලීම් සඳහා පහසුකම් සැලසීම.

2.7.4 ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
(Airports & Aviation Services (Sri Lanka) (Pvt) Limited - AASL)

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත ගුවන් සන්තරණ සේවා සපයන්නා වන ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, එහි ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය මගින්, ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ සෙවීම් සහ මුදවා ගැනීම් ඵලදායී සම්බන්ධීකරණය කිරීම සහ යාබද සෙවීම් සහ මුදවා ගැනීම් කලාප විසින් සිදු කරන්නා වූ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා ඔවුන්ගේ උපරිම හැකියාව සහ සහය ලබා දීම, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය ව්‍යුහය පවත්වා ගැනීම, යාවත්කාලීන වත්මන් ක්‍රියා පටිපාටි සමඟ සුදුසුකම් ලත් සහ පුහුණු සෙවීම් සහ මුදවා ගැනීම් පිරිස් නඩත්තු කිරීමේ වගකීම දරනු ලැබේ.

ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම තවදුරටත් පහත වගකීම් දරනු ලැබේ ;

a. මෙහෙයුම් තනතුරු සහ සෙවීම් සහ මුදවා ගැනීම් මානව සම්පත් අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සැපයීම සමඟ ප්‍රමාණවත් අංග සම්පූර්ණ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානයක් පවත්වා ගැනීම.

b. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් පිළිබඳ මෙහෙයුම් තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය සමඟ මෙහෙයුම් සම්බන්ධීකරණ ගිවිසුමකට ඇතුල් වීම.

c. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය වෙත කාලෝචිත ලෙස, සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයට අදාළ අනතුරු ඇඟවීම් සහ තොරතුරු ලබා දීමට ප්‍රමාණවත් අධීක්ෂණ ගුවන් ගුවන් ගමන් පාලකවරුන් සැපයීම.

d. පැය 24 පදනම මත සේවය කිරීමට ප්‍රමාණවත් ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කාර්ය මණ්ඩලයක් සැපයීම.

e. සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරීන් සහ සහකාර සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරීන් ඇතුළු පුහුණු විශේෂඥ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයීම.

f. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරකවරුන්ට ඔවුන්ගේ වගකීම් ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමට අවශ්‍ය බල ගැන්වීම සැපයීම.

g. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් පිළිබඳව හුරුපුරුදු ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරීන් කාර්ය මණ්ඩලය තුළ නිරන්තරයෙන් පවත්වා ගැනීම.

h. සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරීන්ට අදාළ වගකීම් සහ සුදුසුකම් නිර්ණායක විස්තර කරන සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරීන්ගේ තනතුරු විස්තරය ස්ථාපිත කර පවත්වාගෙන යාම.

i. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානයේ පුද්ගලයින් සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් පුහුණුව ඇතුළත් පුළුල් පුහුණු වැඩසටහනක් ස්ථාපිත කර පවත්වාගෙන යාම.

j. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානයේ රේඩියෝ දුරකථන සන්නිවේදනය සම්බන්ධ නිලධාරීන්ගේ, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO)- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා මට්ටම අවම වශයෙන් 4 අගයෙහි පවත්වා ගැනීම සහතික කිරීම සහ ඔවුන්ට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණත්වය ලබා ගැනීමට පහසුකම් සැලසීම

k. අසල්වැසි රාජ්‍යවල සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථාන, ගුවන් සේවා මෙහෙයුම් මධ්‍යස්ථාන සහ අනෙකුත් මුදවා ගැනීම් මධ්‍යස්ථාන වෙත සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානයේ පුද්ගලයින් විසින් විධිමත් සම්බන්ධීකරණ චාරිකා සඳහා කටයුතු සම්පාදනය කිරීම.

l. ආරක්ෂිත කළමනාකරණය සහ ගුණාත්මකභාවය සහතික කිරීම ඇතුළුව සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා පියවර ක්‍රියාත්මක කිරීම.

m. සෙවීම් සහ මුදවා ගැනීම් හැකියාවේ නිශ්චිත අඩුපාඩු හඳුනා ගැනීම සඳහා වත්මන් සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය පිළිබඳ වාර්ෂික හෝ නිරන්තර විශ්ලේෂණයන් සිදු කිරීම. (අභ්‍යන්තර විගණන ආදිය)

n. ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම්හි පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සෙවීම් සහ මුදවා ගැනීම් අභ්‍යාස (SARExs), කලින් තීරණය කරන ලද විධිමත් කාල පරාසයන් මත සංවිධානය කිරීම.

o. විදේශීය සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් / ඒකක මෙහෙයුම් කටයුතු සඳහා සිවිල් ගුවන් තොටුපළ හරහා පහසුකම් සැලසීම.

2.7.5 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
(Aeronautical Rescue Coordination Centre - ARCC)

කොළඹ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය, රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ස්ථාපිත ගුවන් ගමන් පාලන මධ්‍යස්ථානයට (Area Control Centre, Colombo) යාබදව පිහිටා ඇත.

ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයේ, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිද්ධියක් පිළිබඳ වාර්තා කිරීම සඳහා සම්බන්ධ වීමේ මූලික ස්ථානය, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වේ. එවැනි ගගන නාවික සිදුවීම්වලට අදාළ තොරතුරු, මහජනයාගෙන් හෝ ඍජුවම ගුවන් ගමනාගමන පාලන මධ්‍යස්ථානයකින් පැමිණිය හැකිය.

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය තවදුරටත් පහත වගකීම් දරනු ලැබේ;

a. සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් දක්වා වර්ධනය විය හැකි ගුවන් යානා ආපදා පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම.

b. මුහුද ආශ්‍රිතව සිදුවන සිදුවීම් සඳහා, සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කර, සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය දැනුවත් කිරීම සහ සිද්ධිය සිදු වූ ස්ථානය සොයා ගැනීමට සහාය ඉල්ලා සිටීම.

c. ගොඩබිම ආශ්‍රිතව සිදුවන සිදුවීම් සඳහා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සුදුසු පරිදි සම්බන්ධීකරණය කිරීමෙන්, ඔවුන්ගේ සෙවීම් සහ මුදවා ගැනීමේ ඒකක ජාලයෙන් අවශ්‍ය සහාය ලබා ගැනීම.

d. ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුවට සිදුවීම සම්බන්ධව දැනුම් දීම.

e. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකරණය සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක (Search Mission Coordinator) කාර්යභාරය පවරාගෙන කටයුතු කිරීම.

f. අනතුරට/ සිදුවීමට මුහුණ දුන් ගුවන් යානයේ 'සෙවීම් තොරතුර' (Search Datum) නිර්ණය කිරීම.

g. සෙවුම් ප්‍රදේශය (Search Area) සහ ක්‍රියාත්මක කළ යුතු සෙවුම් රටා (Search Patterns) නිර්ණය කිරීම.

h. සෙවුම් සැලසුම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා සම්මත මෙහෙයුම් පටිපාටි සක්‍රිය කිරීම.

i. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමේ අවසානය වාර්තා කිරීම.

ඉහත සඳහන් කළ මෙහෙයුම් අවශ්‍යතාවලට අමතරව, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය පහත වගකීම් ද දරනු ලැබේ;

j. සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථාන, දේශීය රෙගුලාසිවල දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය විස්තර කිරීම සඳහා උපකාර වන ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් අත්පොත සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.

k. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සැලසුම් සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම, සන්නිවේදනය සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණය සකස් කිරීම සහ අනෙකුත් සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක සඳහා සහය සැපයීමට අවශ්‍ය තත්වයන් සැකසීම.

l. අන්තර්ජාලය පදනම් කරගත් සෙවීම් සහ මුදවා ගැනීම් තොරතුරු හුවමාරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

m. ගොඩබිම තුළ සිදු වන ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් සම්බන්ධව තොරතුරු සැපයීම සහ සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සමඟ සන්නිවේදන නාලිකා පිහිටුවීම.

n. රාජ්‍ය සෙවීම් සහ මුදවා ගැනීම් පහසුකම්, සෙවීම් සහ මුදවා ගැනීම් උපකරණ සහ සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකවල වත්මන්, විස්තීර්ණ, ඉලෙක්ට්‍රොනික ලැයිස්තුවක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම.

o. සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) සමඟ සමීපතම ප්‍රායෝගික සම්බන්ධීකරණය, අනුකූලතාව සහ සහයෝගීතාව සහතික කර පවත්වාගෙන යාම.

p. සෙවීම් සහ මුදවා ගැනීමේ උප මධ්‍යස්ථාන සහ අනෙකුත් තොරතුරු ප්‍රභවයන් සමඟ සෙවීම් සහ මුදවා ගැනීම් ආපදා අනතුරු ඇඟවීමේ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම.

q. ආපදා සංඥා සම්ප්‍රේෂක (Distress Beacon) ඔස්සේ සම්ප්‍රේෂණය වන, අනතුරු ඇඟවීමේ ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම සඳහා ක්‍රියා පටිපාටි සහ අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කිරීම.

r. කොළඹ සෙවීම් සහ මුදවා ගැනීමේ කලාපය (SRR) තුළ ලියාපදිංචි වී ඇති ආපදා සංඥා සම්ප්‍රේෂක (Distress Beacon) වල වත්මන් ලැයිස්තුවක් පවත්වා ගැනීම.

s. අර්ධ හෝ සම්පූර්ණ සෙවීම් සහ මුදවා ගැනීම් සේවා බිඳ වැටීම්වලදී සෙවීම් සහ මුදවා ගැනීම් සේවා තාවකාලිකව සැපයීම සඳහා සැලසුම් සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සහ පහසුකම් ස්ථාපිත කිරීම.

t. නිශ්චිත කාල පරාසයන් තුළ, සෙවීම් සහ මුදවා ගැනීම් අභ්‍යාස පැවැත්වීම මඟින් සම්බන්ධීකරණ ක්‍රියා පටිපාටි, දත්ත සහ තොරතුරු හුවමාරු කර ගැනීම සහ සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර පරීක්‍ෂා කිරීම සහ ඇගයීම සිදු කිරීම.

ආරක්‍ෂක අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති 2.7.6, 2.7.7, 2.7.8, 2.7.9 සහ 2.7.10 හි සඳහන් පහත දැක්වෙන ආයතන වෙත , විපතට පත් ගුවන් යානාවලට සහ ගුවන් යානා අනතුරුවලින් දිවි ගලවා ගත් අයට වහා සහාය වීම සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක සැපයීම සඳහා කාර්යභාරයන් සහ වගකීම් පැවරී ඇත.

2.7.6 ශ්‍රී ලංකා නාවික හමුදාව (Sri Lanka Navy - SLN)

ශ්‍රී ලංකා නාවික හමුදාව යනු, ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයෙහි (SRR) සාගර කොටස තුළ, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය සහ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් වලදී, මූලික සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක (SRU) සපයන්නා වේ.

ශ්‍රී ලංකා නාවික හමුදාව පහත වගකීම් දරනු ලැබේ ;

a. සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) ස්ථාපිත කර පවත්වාගෙන යාම.

b. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් පිළිබඳ මෙහෙයුම් තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

(AASL) පවත්වාගෙන යන, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) සමඟ මෙහෙයුම් සම්බන්ධීකරණ ගිවිසුමකට (OCA) ඇතුල් වීම.

c. ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයට අයත් සාගර කොටස තුළ සිදු වන, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සඳහා සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් (Maritime SAR Assets) සමඟ ප්‍රතිචාර දැක්වීම.

d. දිවයිනේ ජලාශයක් ආශ්‍රිතව සිදුවන ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් (SAR Assets) සමඟ ප්‍රතිචාර දැක්වීම.

e. සිදුවීමේදී දිවි ගලවා ගත් අය සහ සුන්බුන් සොයා ගැනීම සඳහා ප්‍රමිතීන්ට අනුව විස්තර කර ඇති සෙවීම් රටා (Search Patterns) සහිත සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.

f. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා සුදුසු පරිදි අත්‍යාවශ්‍ය සෙවීම් සහ මුදවා ගැනීම් උපකරණ සමඟ කිමිදුම්කරුවන් ඇතුළු පුහුණු පුද්ගලයින් යෙදවීම.

g. ප්‍රවේශ විය නොහැකි හෝ දූරස්ථ ගොඩබිම් ප්‍රදේශවලින් හෝ ජලයෙන් ප්‍රවේශ විය හැකි නමුත් ගොඩබිමෙන් ප්‍රවේශ විය නොහැකි ප්‍රදේශවලින්, තුවාල ලැබූ පුද්ගලයන් බේරා ගැනීමට කටයුතු කිරීම.

h. විපතට පත් ගුවන්යානා වලට ප්‍රතිචාර දැක්වීමට සහ ගුවන්යානා අනතුරුවලින් දිවි ගලවා ගත් අය බේරා ගැනීමට, එසැනින් ප්‍රතිචාර දැක්වීම සඳහා නාවික සහාය සම්බන්ධීකරණය කිරීම.

2.7.7 සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
(Maritime Rescue Coordination Centre - MRCC)

සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය යනු, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකාරක වන අතර, ඔවුන් විසින් දැනුවත් හෝ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් දැනුම් දෙන ලද, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකට ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මට අනුව ප්‍රතිචාර දැක්වීම සඳහා වගකීම දරයි.

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධව සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට අදාළ වගකීම් පහත පරිදි වේ;

a. සමුද්‍රයට ඉහළින් ඇති අවකාශය තුළ විපතට පත් ගුවන් යානයක් සම්බන්ධයෙන් ආපදා අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානයකින් හෝ වෙනත් ඕනෑම තොරතුරු ප්‍රභවයකින්, ආපදා අනතුරු ඇඟවීම් හෝ අදාළ තොරතුරු ලබාගෙන, එය ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ අනෙකුත් අදාළ සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක (SRU) වෙත යොමු කිරීම.

b. සමුද්‍රයට ඉහළින් ඇති අවකාශය තුළ, විපතට පත් ගුවන් යානා සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් පටිපාටි (SOP) ක්‍රියාත්මක කිරීම.

c. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) සමග එකඟතාවයෙන්, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක (SMC) භූමිකාවට අදාළ කාර්යභාරය පවරාගෙන කටයුතු කිරීම.

d. සමුද්‍රයට ඉහළින් ඇති අවකාශය තුළ සිදු වී ඇති ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා පහසුකම් සැලසීම.

ප්‍රධාන මෙහෙයුම් වගකීම්වලට අමතරව, සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට අදාළ වගකීම් පහත පරිදි වේ;

e. අඛණ්ඩ නාවික ගුවන්විදුලි ආපදා තොරතුරු සවන්දීමේ සේවාවක් සැපයීම;

f. සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා මෙහෙයුම් සැලසුම් සහ ක්‍රියා පටිපාටි, සන්නිවේදනය සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණය සහ අනෙකුත් සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක (SRU) වෙත සහාය සැපයීම විස්තර කරන සම්මත මෙහෙයුම් පටිපාටි (SOP) ඇතුළත්, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් අත්පොත සකස් කර පවත්වාගෙන යාම.

g. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) සමග සමීපතම ප්‍රායෝගික සම්බන්ධීකරණය, අනුකූලතාව සහ සහයෝගීතාව පවත්වාගෙන යාම.

h. සෙවීම් සහ මුදවා ගැනීම් උප මධ්‍යස්ථාන (RSC) සහ වෙළඳ නැව්, ධීවර ප්‍රජාව ඇතුළු සාගරයේ අනෙකුත් තොරතුරු ප්‍රභවයන් සමග සෙවීම් සහ මුදවා ගැනීම් ආපදා සම්බන්ධ අනතුරු ඇඟවීමේ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම.

i. සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (RCC) අංගසම්පූර්ණ ලෙස ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් සහිතව පවත්වාගෙන යාම.

j. සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ (MRCC) නිලධාරීන් සඳහා පරිපූර්ණ පුහුණු වැඩසටහන් සකස් කිරීම.

k. ගුවන්විදුලි දුරකතන සන්නිවේදනය සම්බන්ධ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ (MRCC) නිලධාරීන් සතු ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය සහතික කිරීම.

l. සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ (MRCC) නිලධාරීන්, අනෙකුත් සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථාන (RCC), ගුවන් සමාගම් මෙහෙයුම් මධ්‍යස්ථාන සහ අසල්වැසි රාජ්‍යවල සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථාන (RCC) වෙත සම්බන්ධීකරණ සංචාරයන් සඳහා යොමු කිරීම.

m. නිශ්චිත කාල පරාසයන් තුළ, සෙවීම් සහ මුදවා ගැනීම් අභ්‍යාසයන් පැවැත්වීම මගින් සම්බන්ධීකරණ ක්‍රියා පටිපාටි, දත්ත සහ තොරතුරු හුවමාරු සහ සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර පරීක්ෂා කිරීම සහ ඇගයීම සිදු කිරීම.

n. සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ආරක්ෂිත කළමනාකරණය සහ ගුණාත්ව සහතික කිරීමේ පද්ධති ඇතුළු ඇගයීම් ක්‍රියාත්මක කිරීම.

2.7.8 ශ්‍රී ලංකා ගුවන් හමුදාව (Sri Lanka Air Force - SLAF)

ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR) තුළ සිදුවන, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සඳහා ගුවන් සෙවීම් සහ මුදවා ගැනීමේ ඒකක (SRU) සපයන මූලික ආයතනය ශ්‍රී ලංකා ගුවන් හමුදාවයි. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන වගකීම් පහත දැක්වේ :

a. සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා සන්නිවේදන නාලිකා සම්බන්ධතා පිහිටුවීම.

b. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකදී දිවි ගලවා ගත් අය සහ සුන්බුන් සොයා ගැනීම සඳහා සෝදිසි මෙහෙයුම් සිදු කිරීමට අවශ්‍ය ගුවන් සෙවීම් සහ මුදවා ගැනීමේ ඒකක (SRU) යෙදවීම.

c. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වල නිරත වීම සඳහා ගුවන් සෙවීම් සහ මුදවා ගැනීමේ ඒකක (SRU) සැපයීම.

d. සුදුසු සෙවීම් සහ මුදවා ගැනීම් උපකරණ සමග සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා පුහුණු නිලධාරීන් යෙදවීම.

e. සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සම්බන්ධ තත්‍ය කාලීන තොරතුරු (real time information), සුදුසු සෙවීම් සහ මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථාන වෙත යොමු කිරීම.

f. සෙවීම් සහ මුදවා ගැනීමේ ඒකක (SRU) සිදුවීමේ ස්ථානයට යොමු කිරීම සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම්වලට අදාළ ගුවන් නිරීක්ෂණ ලබා දීම.

g. දිවි ගලවා ගත් අය සඳහා හදිසි ප්‍රවාහන අවශ්‍යතා සපයා දී ආරක්ෂිත ස්ථාන වෙත යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.

h. ගුවන්යානා ආපදා සහ හදිසි අවස්ථාවලදී දිවි ගලවාගත් අය වෙත, ගුවන්යානා මගින් ගුවනේ සිට පහළට දැමීම සඳහා දිවි රැක ගැනීමේ සහාය උපකරණ, සුදුසු ගුවන් තොටුපළ වල යෝග්‍ය ලෙස ඇසුරුම් කර ස්ථානගත කිරීම.

2.7.9 ශ්‍රී ලංකා යුද්ධ හමුදාව (Sri Lanka Army - SLA)

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ස්ථාපිත ගුවන් තොටුපළ ප්‍රතිචාර දක්වන ප්‍රදේශවලින් ඔබ්බට සිදුවන ගොඩබිම් පදනම් වූ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා ප්‍රධාන සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් සපයන්නා වේ. ශ්‍රී ලංකාව තුළ ගොඩබිම් ප්‍රදේශයන්හි මුදවා ගැනීමේ සහ සහන මෙහෙයුම් සම්බන්ධීකරණය හා සම්බන්ධ කිරීමේ වගකීම් සමගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාළ වගකීම් පහත පරිදි වේ :

a. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සිදු කිරීම සඳහා භටපිරිස් යෙදවීම. මෙයට ගොඩබිම සිදුවන සමූහ මුදවා ගැනීමේ මෙහෙයුම් (MROs) ද ඇතුළත් විය යුතුය.

b. දිවි ගලවාගත් අයට මූලික වෛද්‍ය පහසුකම් සැලසීම.

2.7.10 ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය (Sri Lanka Coast Guard - SLCG)

සමුද්‍රය ආශ්‍රිත ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකදී, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වලට සහභාගී වීම සහ මුදවා ගැනීමේ මෙහෙයුම්වලදී ප්‍රධාන සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක සඳහා අවශ්‍ය සහය ලබා දීම, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ වගකීම වේ.

ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය පහත වගකීම් දරනු ලැබේ ;

a. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සඳහා අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

b. ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ ස්ථාපිත මුදවා ගැනීමේ උප මධ්‍යස්ථාන ජාලය මගින් ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා සහාය ලබා දීම.

c. පවතින සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම්, ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයෙහි සාගර කොටස තුළ සිදුවන ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා යෙදවීම.

d. සුදුසු පරිදි, කිමිදුම්කරුවන් ඇතුළු අත්‍යවශ්‍ය සෙවීම් සහ මුදවා ගැනීම් උපකරණ සමග සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා පුහුණු පුද්ගලයින් යෙදවීම.

e. ශ්‍රී ලංකාවේ මුහුදු සීමාව තුළ හමුවන ගුවන් යානා සුන්බුන් සඳහා අවශ්‍ය ආරක්ෂාව සැපයීම.

විපතට පත් ගුවන් යානාවලට සහ ගුවන් යානා අනතුරුවලින් දිවි ගලවා ගත් අයට වහා සහාය වීම සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක සැපයීමට කාර්යභාරයන් සහ වගකීම් 2.7.11, 2.7.12, 2.7.13 සහ 2.7.14 හි සඳහන් පහත සඳහන් ආයතනවලට පවරා ඇත.

2.7.11 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (Disaster Management Centre - DMC)

ස්වභාවික විපත් සහ ජාතික හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා ස්ථාපිත දීප ව්‍යාප්ත රාජ්‍ය පරිපාලක ජාලයක් සහිත රාජ්‍ය ආයතනය වන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පහත වගකීම දරයි:

a. ජාතික හදිසි අවස්ථා හා සම්බන්ධ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි පවතින සම්මතයන් සහ ක්‍රියා පටිපාටිවලට ගුවන් යානා සිදුවීම් සහ අනතුරු සඳහා ප්‍රතිචාර ඇතුළත් කිරීම.

b. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් පිළිබඳ, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය වෙතින් තොරතුරු ලබාගැනීම සඳහා සන්නිවේදන නාලිකා සම්බන්ධතා පිහිටුවීම.

c. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අනුබද්ධිතව පිහිටුවා ඇති දීප ව්‍යාප්ත රාජ්‍ය ආයතන සහ නියෝජිත ආයතන ජාලය මගින් සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සහ සහන කටයුතු කළමනාකරණය සහ කාර්යක්ෂම, ඵලදායී, කාලෝචිත සහ කඩිනම් සම්බන්ධීකරණය සහතික කිරීම.

d. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය තුළ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් වලදී, සමූහ මුදවා ගැනීමේ මෙහෙයුම් පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම.

2.7.12 ශ්‍රී ලංකා පොලිසිය (Sri Lanka Police)

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් අතරතුර, ශ්‍රී ලංකා පොලිසියට අදාළ වගකීම් පහත පරිදි වේ:

a. ගොඩබිම සිදුවන ගුවන් යානා අනතුරු හෝ ගුවන් යානා ආශ්‍රිත හදිසි අවස්ථා පිළිබඳව ක්ෂණිකව සහ සෘජුව සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථාන වෙත දැනුම් දීම සඳහා ශ්‍රී ලංකා ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය තුළ, දීප ව්‍යාප්ත පොලිස් ස්ථාන ජාලය තුළින් අනතුරු ඇඟවීමේ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.

b. සුදුසු පරිදි සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සිදුකිරීම සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යෙදවීම ඇතුළුව අවශ්‍ය පුහුණු සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම් සැපයීම.

c. ගුවන් යානා අනතුර/සිදුවීම සිදු වූ ප්‍රදේශය තුළ ආරක්ෂාව සම්බන්ධ වගකීම පවරාගෙන කටයුතු කිරීම.

d. අනතුරු/සිදුවීම් ස්ථානය ඇතුළු සුන්බුන් සඳහා ආරක්ෂාව සැපයීම.

e. නීතිය බලාත්මක කිරීමේ අධිකාරිය ලෙස කටයුතු කිරීම.

f. අනතුර/සිදුවීම සිදු වූ ප්‍රදේශය තුළට/පිටතට හදිසි සහ අනෙකුත් සහන සලසන, වාහන ප්‍රවාහය කළමනාකරණය කිරීම.

g. සිද්ධිය වූ ස්ථානයට මහජන පැමිණීම පාලනය කිරීම සහ ප්‍රදේශය තුළ මහජනයාට සිදු විය හැකි අනතුරු සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

2.7.13 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology - DOM)

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගුවන් සේවා කාලගුණ විද්‍යා සේවා සපයන්නා වන අතර, කාලගුණය ආශ්‍රිත දත්ත සහ සමුද්‍රය ආශ්‍රිත ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා වන සිදුවීම් සඳහා අදාළ ස්ථානයේ කාලගුණික තත්ත්වයන්, කාලගුණ වාර්තා සහ අනාවැකි වැනි තොරතුරු සැපයීමේ වගකීම දරයි. දත්ත ලබා ගැනීමේ හැකියාව අනුව, පහත සඳහන් තොරතුරු සැපයීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අදාළ වගකීම් පහත පරිදි වේ,

- සමුද්‍රය මතුපිට සහ ඉහළ මට්ටම්වලදී සුළං දිශාව සහ වේගය.
- සෙවීම් ප්‍රදේශයේ වලාකුළු ස්ථරයේ උස (අවශ්‍ය වන සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් යෙදවීම සඳහා මෙය වැදගත් තොරතුරක් වනු ඇත).
- සෙවීම් ප්‍රදේශයේ දෘශ්‍යතාවය සහ උෂ්ණත්වය.
- පවතින සමුච්චිත (Cumulonimbus) වලාකුළු, වර්ෂාව සහ වෙනත් විශේෂ කාලගුණික තත්ත්වයන් හෝ එවැනි කාලගුණික තත්වයන් වර්ධනය වීමේ හැකියාව පිළිබඳව ඇති තොරතුරු.

2.7.14 ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

(Department of Immigration and Emigration Sri Lanka)
ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අදාළ වගකීම් පහත පරිදි වේ :

a. ගුවන් යානා අනතුරක් හේතුවෙන් අතරමැදි ගුවන් ගමන් මග හැරෙන, දිවි ගලවා ගත් මගීන් සඳහා දෙපාර්තමේන්තුව මගින් තාවකාලික වීසා බලපත්‍රයක් නිකුත් කළ හැකිය. අවශ්‍ය අවස්ථාවලදී දෙපාර්තමේන්තුවට අදාළ ගුවන් සමාගම් සමග අදාළ කටයුතු සම්බන්ධීකරණය කළ හැකිය.

b. අපේක්ෂිත මාර්ගය / ගමනාන්තය වෙනස් අවස්ථාවල, දිවි ගලවා ගත් මගීන් ශ්‍රී ලංකාව වෙත නිසි ලෙස ලේඛනගත නොවිය හැක; මෙම තත්ත්වයන් යටතේ තාවකාලික වීසා බලපත්‍රයක් සහ වෙනත් ආකාරයේ පහසුකම් ලබාදීමට දෙපාර්තමේන්තුව මගින් පහසුකම් සැලසිය හැක.

c. ගුවන් අනතුරකින් හෝ වෙනත් ආකාරයකින් ගමන් ලියකියවිලි විනාශ වූ, දිවි ගලවා ගත් විදේශීය මගීන් සඳහා දෙපාර්තමේන්තුව මගින් හැඳුනුම්පතක් නිකුත් කළ හැකිය. ඔහුගේ/ ඇයගේ අදාළ රටවල තානාපති කාර්යාල හෝ වෙනත් එවැනි වගකීම් සහිත ආයතන ශ්‍රී ලංකාව තුළ නොමැති අවස්ථා වලදී, විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඔහුගේ/ඇයගේ ජාතිකත්වය තහවුරු කිරීමෙන් පසු අදාළ ලේඛන සැකසිය හැක.

d. ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා අදාළ ගුවන් සමාගම් වල බලයලත් නියෝජිතයන්, තාක්ෂණික විශේෂඥයන්, විදේශීය විමර්ශකයින්, භාෂා පරිවර්තකයන් සහ අනෙකුත් අවශ්‍ය පිරිස් පැමිණෙන විට, සිදුවීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය වීසා සහ වීසා දිගුවක් නිකුත් කළ හැකිය.

e. අනතුරට පත් ගුවන් යානය සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාවට අදාළ ඕනෑම කරුණක් විමර්ශනය කිරීම සඳහා දේශීය හා විදේශීය විමර්ශකයින්ට අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් සහාය වීමට දෙපාර්තමේන්තුවට හැකියාව ඇත.

f. ගුවන් යානයක් අනතුරට ලක්වන අවස්ථාවේ අදාළ මානුෂීය මෙහෙයුම සඳහා සහාය දක්වන සියලුම ආයතන සමඟ සන්නිවේදන සම්බන්ධතා පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ඇත.

2.7.15 සෞඛ්‍ය අමාත්‍යාංශය (Ministry of Health)

සියලුම රජයේ සෞඛ්‍ය ආයතන සහ නියෝජිත ආයතනවල පාලනය සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වන අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය පහත වගකීම් දරනු ලබයි:

a. සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් සම්බන්ධව විශ්වාසනීය ප්‍රභවයකින් ඉල්ලීමක් හෝ තොරතුරු ලැබීමත් සමග සුදුසු වෛද්‍ය ප්‍රතිකාර සංවිධානය කිරීම.

b. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකදී, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා පුහුණු පළපුරුදු වෛද්‍ය නිලධාරීන් සහ උපකරණ කඩිනමින් යෙදවීම.

c. මූලික වෛද්‍ය පහසුකම් සහිත ස්ථානයකට යොමු කිරීම , මූලික වෛද්‍ය ආධාර සහ වෛද්‍ය උපදෙස් ලබා දීම.

d. සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් සඳහා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වෛද්‍යවරුන්, හෙදියන් සහ අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය ඇතුළු ප්‍රමාණවත් මානව සම්පත් පවතින බවට සහතික වීම.

e. ඕනෑම සමූහ මුදවා ගැනීමේ මෙහෙයුමක් (Mass Rescue Operation) සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය ගිලන්රථ සහ අනෙකුත් ජංගම සෞඛ්‍ය සේවා පහසුකම් සූදානම් ලෙස පවතින බවට සහතික වීම.

2.7.16 විදේශ කටයුතු අමාත්‍යාංශය (Ministry of Foreign Affairs)

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සම්බන්ධයෙන් අන්තර් රාජ්‍ය සම්බන්ධීකරණය සඳහා මූලික අමාත්‍යාංශය ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශය පහත වගකීම් දරනු ලබයි :

a. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා සහාය ලබා ගැනීම සම්බන්ධව අවශ්‍ය පරිදි වෙනත් රටවල රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩල සමග සම්බන්ධීකරණය කිරීම.

b. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් වලදී ජාත්‍යන්තර සැපයුම් සංවිධානය සහ සැලසුම් කිරීම සම්බන්ධව අවශ්‍ය පරිදි සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම.

c. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වලට සම්බන්ධ වන විදේශීය ගුවන් යානා සඳහා දිවයිනට ඉහළින් පියාසර කිරීමට හෝ ගොඩබෑමට අවසර දීම සඳහා, අවශ්‍ය පරිදි එම විෂයය සම්බන්ධ රේඛීය රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වීමෙන් පහසුකම් සැලසීම.

d. සෙවීම් සහ මුදවා ගැනීම් සහ හදිසි අනතුරු/සිදුවීම් විමර්ශන සම්බන්ධ විදේශීය විශේෂඥයින්ගේ පැමිණීම සඳහා පහසුකම් සැලසීම.

e. අසල්වැසි රාජ්‍යයන් සමග සෙවීම් සහ මුදවා ගැනීම් ගිවිසුම් ඇති කර ගැනීම සඳහා පහසුකම් සැලසීම.

2.7.17 මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

(Ministry of Finance, Economic Stabilization and National Policies).

ඕනෑම ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක් සඳහා පහසුකම් සැලසීම සහ සිවිල් ගුවන් යානයක් ඉල්ලා සිටීම හෝ සේවා කැඳවූ පුද්ගලයින්ට ගෙවීම් සිදු කිරීම , ඕනෑම සිවිල් ගුවන් යානයක් එහි හිමිකරුගෙන් හෝ ක්‍රියාකරුගෙන් ඉල්ලා සිටීම සහ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා සහාය වීමට අත්‍යවශ්‍ය විය හැකි ඕනෑම පුද්ගලයෙකු සේවාවන් සඳහා කැඳවීමට අදාළ ගෙවීම් තීරණය කිරීම සඳහා අවශ්‍ය උපදේශන සැපයීමට මුදල් අමාත්‍යාංශය සහාය වනු ඇත.

ඉහත සඳහන් කළ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමකදී, යොදවා ඇති සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් සඳහා කරනු ලබන ඕනෑම ගෙවීමක් බලාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය වේ.

2.7.18 ශ්‍රී ලංකා රේගුව (Sri Lanka Customs)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ පවතින ශ්‍රී ලංකා රේගුවට අදාළ වගකීම් පහත පරිදි වේ:

a. සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක වෙනත් රටවලින් ආනයනය කිරීමට අදහස් කරන සෙවීම් සහ මුදවා ගැනීම්වලදී භාවිතා කළ යුතු උපකරණ, රේගු නිෂ්කාශනය කඩිනම් කිරීම මගින් ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කටයුතු සඳහා පහසුකම් සැලසීම.

b. තාවකාලික පදනමක් මත උපකරණ මෙන්ම පරිභෝජන ද්‍රව්‍ය කඩිනම් නිෂ්කාශනය සිදු කළ හැකි අතර රේගු විධිවිධාන අවසන් කිරීම සඳහා අදාළ පාර්ශවය, අදාළ ලේඛන පසුව රේගුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

c. එවැනි භාණ්ඩ ප්‍රතිඅපනයනය කිරීම සඳහා රේගු නීතිය යටතේ ඇති අවශ්‍යතා සපුරාලිය යුතු අතර ආනයනය කළ දින සිට වසරක් ඇතුළත ප්‍රතිඅපනයනය කළ යුතුය.

d. විපතට පත් ගුවන් යානයෙන් මුදවා ගන්නා ලද භාණ්ඩ/අයිතම ශ්‍රී ලංකාව වෙත යොමු කරන ලද භාණ්ඩ/අයිතම වුවද, නොවුවද, ඒවා බැහැර කිරීම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකා රේගුවේ විෂය පථය යටතේ පවතී.

2.7.19 ධීවර අමාත්‍යාංශය (Ministry of Fisheries)

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වල දී සහය ලබාගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය විෂයය පථය යටතේ පවතින, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මෙහෙයවීමේ වගකීම ධීවර අමාත්‍යාංශය සතු වේ.

a. දේශීය ධීවර ප්‍රජාව මගින් ලැබෙන සමුද්‍රය ආශ්‍රිත ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් තොරතුරු සම්බන්ධව අදාළ ආයතන දැනුවත් කිරීම.
b. මුහුදේ සිදු කරන සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා දේශීය ධීවර ප්‍රජාවගේ සහාය ලබා ගැනීම.
c. බහුදින ධීවර යාත්‍රා මගින් ලැබෙන, සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ සිදුවන කිසියම් ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් හදිසි අවස්ථාවක් සම්බන්ධ තොරතුරු, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය (ARCC) සමග ක්ෂණිකව හුවමාරු කර ගැනීමේ වගකීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සතු වේ.
d. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් ක්‍රියා පටිපාටි පිළිබඳව සියලුම බහුදින නාවිකයින් ඇතුළු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.
e. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ගුවන්විදුලි සන්නිවේදන නිලධාරීන් (Radio Communication Officers) දැනුවත් කිරීම සහ පුහුණුව සහ ලබා දීම.

2.7.20 ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය

(National Aquatic Resources Research and Development Agency NARA)
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය (NARA) යනු, ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් විෂයයයෙහි පර්යේෂණ, සංවර්ධන සහ කළමනාකරණ කටයුතු සිදුකිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් වගකිව යුතු ජාතික ආයතනයයි.

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සම්බන්ධයෙන් දත්ත සැපයීම සඳහා, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනයෙහි ජාතික ජල විද්‍යාත්මක සහ ජාතික සාගර විද්‍යා ආයතනය වගකීම දරයි:

a. සෙවීම් ප්‍රදේශ සැලසුම් කිරීමේ දී වැදගත් සාධකයක්වන මුහුදු ජලයේ අඛණ්ඩ, ඍජු වලනය සහ වඩදිය ඇතුළු මුහුදු මට්ටමේ දත්ත.

b. සමුද්‍රීය සෙවීම් ක්‍රියාකාරකම් සඳහා වැදගත්වන අදාළ මුහුදු ප්‍රදේශවල ගැඹුර පිළිබඳ දත්ත.

c. රට තුළ සෙවීම් සහ මුදවා ගැනීමේ ප්‍රයත්නයන් සඳහා උපකාර වන ගංගා, විල්, වැව් සහ ජලාශ වැනි අභ්‍යන්තර ජල මූලාශ්‍රවලට අදාළ දත්ත.
d. සෙවීම් කාලය අවම කිරීම සඳහා සාගර ආකෘති නිර්මාණයන් භාවිතා කරමින්, සෙවීම් සහ මුදවා ගැනීමේ ප්‍රදේශය සොයා ගැනීමට ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය හට සහාය වීම.

2.7.21 ශ්‍රී ලංකා වරාය අධිකාරිය (Sri Lanka Ports Authority)

ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රධාන වරායන්හි රජය වෙනුවෙන් වන මෙහෙයුම් ආයතනය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමුද්‍රය ආශ්‍රිත ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා අවශ්‍ය වත්කම් සපයන්නෙකු ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු විශේෂඥ සහ පුහුණු කාර්ය මණ්ඩලය අවශ්‍ය වූ විට විපතට පත් ගුවන් යානා සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සැපයීමට සහ අවශ්‍යවන පරිදි යානයේ සුන්බුන් සොයා ගැනීමට සහාය වීමට ඉතා වැදගත් වනු ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පහත වගකීම් දරනු ලබයි :

a. සමුද්‍රය ආශ්‍රිත සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා ආධාර සහ සහාය සැපයීම.
b. ගුවන් යානයක් මුහුදට පතිත වී ඇති වන ගුවන් අනතුරක දී, අවශ්‍යවන පරිදි යානයේ සුන් බුන් සොයා ගැනීමට සහාය වීම සහ එම යානාවේ තිබිය හැකි ගුවන් තෙල් මගින් ඇති විය හැකි පරිසර හානිය අවම කිරීමට සහාය දීම.

2.8 සහයෝගිතා කොන්දේසි

2.8.1 සෙවීම් සහ මුදවා ගැනීම් පාර්ශවකරුවන්ගෙන් සැදුම් ලත් මෙම සංවිධානය, පහත කරුණු සහතික කිරීම සඳහා ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මට සහාය දීමට එකඟ වේ.

a) සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් සහ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාව එකඟ වී සිටින කොන්දේසි ඉටුකරළීම.

b) ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණය සඳහාවන මෙම ජාතික ප්‍රවේශය අඛණ්ඩව සහ ශක්තිමත්ව පවත්වා ගෙන යාම;

c) සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක දී, අදාළවන තීරණ ගැනීමේ දී සහයෝගීව සහ සාමූහිකව කටයුතු කිරීමේ පහසුව සඳහාවන යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කරළීම; සහ

d) ඉහත එකඟතාවයන් යටතේ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමකදී ශ්‍රී ලංකාව සතු වගකීම් ඉටු කරළීම.

2.8.2 සියලුම පවතින සහ සංවර්ධනය කිරීමේ හැකියාව සහිත සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන්, ඒකාබද්ධ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සහ පුහුණුව සම්බන්ධයෙන් වූ සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා යොදවා ගැනීමට එකඟ වේ. මෙහි දී අදාළ සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම, සෙවීම් සහ මුදවා ගැනීම් සිද්ධියකදී සහාය ලබා ගත හැකි ආකාර, සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධ අන්‍යෝන්‍ය පුහුණු අවස්ථා සහ සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සපයන්නන් එක් අයෙකුට වඩා සහභාගීවන සහ සම්බන්ධීකරණය සිදුකරන ඕනෑම අවස්ථාවක, සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණය සඳහා අදාළ වන යාන්ත්‍රණයන් ඇතුළත් විය යුතුය.

2.9 සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා පාර්ශවකරුවන් වූ ආයතනවල වත්කම් හෝ සැපයුම් දායකත්වය

2.9.1 සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා පාර්ශවකරුවන් වූ ආයතන, විස්තර කර ඇති කාර්යභාරයන් සහ වගකීම්වලට අනුකූලව ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

2.9.2 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම සඳහා පාර්ශවකරුවන් වූ ආයතන විසින්, මෙහි දක්වා ඇති ඔවුනොවුන්ගේ කාර්යභාරයන් හෝ වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍යවන වත්කම් හෝ සැපයුම් ලබා ගැනීම සැලසුම්කරණය කළ යුතුය.

2.10 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සඳහා අයකිරීම

2.10.1 අනතුරට හෝ විපතට පත් වූ පුද්ගලයෙකුට/ පුද්ගලයින්ට උපකාර කිරීම සඳහා යම් රාජ්‍යයක් වෙනත් රාජ්‍යයකින් සහාය ඉල්ලා සිටින විට, එවැනි උපකාරයක් සපයන්නේ නම්, චාරිත්‍ර මූලධර්මයන් ඇතුළත් ජාත්‍යන්තර නීතිවලට අනුකූලව, එය ස්වේච්ඡාවෙන් සිදුකරනු ලබන අතර, ශ්‍රී ලංකාව ඒ සඳහා ඉල්ලීමක් හෝ ගෙවීමක් හෝ එවැනි ආධාර සඳහා පිරිවැය ආපසු ගෙවීමක් සිදු නොකරයි.

2.10.2 අනතුරට පත් වූ හෝ විපතට පත් වූ පුද්ගලයන්ට සපයන සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන්, සහය ලත් පුද්ගලයාගෙන් /පුද්ගලයින්ගෙන් පසුකාලීන පිරිවැය-ප්‍රතිසාධනයකින් තොරව සිදු කරන බවට සහභාගී වන සෙවීම් සහ මුදවා ගැනීම් පාර්ශවකරුවන් එකඟ වෙති.

2.10.3 වෙනත් ආකාරයකින් කල්තියා සකස් කර ඇත්නම් මිස, සෙවීම් සහ මුදවා ගැනීම් පාර්ශවකරුවන් විසින්, මෙම සැලැස්මට අදාළව තමන්ගේම ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සපයා ගත යුතු අතර, ඔවුන් අතර පිරිවැය ප්‍රතිපූරණය කිරීමේ කාරණයක් නිසා අනතුරට හෝ විපතට පත් ඕනෑම පුද්ගලයෙකුට ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද කිරීමට ඉඩ නොදේ.

2.10.4 සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින්, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක් සඳහා පුද්ගලික ආයතන වෙතින්, භාණ්ඩ සහ සේවා කුලියට ගැනීමට හෝ ඉල්ලුම් කිරීම සඳහා හැකියාව පවතින අවස්ථාවක , වෙනත් ආකාරයකින් එකඟ වී නොමැති නම්, එවැනි ඉල්ලීම් සඳහා කුලියට ගැනීමේ හෝ වන්දි ගෙවීමේ ඕනෑම පිරිවැයක් දරනු ඇත.

**3. ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්**

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහාවන සමස්ත වගකීම, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (Airport & Aviation Services (Sri Lanka) (Pvt) Ltd) මගින් පාලනයවන ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) වෙත පැවරී ඇත. එසේ වුව ද, සමුද්‍රය ආශ්‍රිත ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් සඳහා මෙම වගකීම ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම්

සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) අතර අනෙයා්න්‍ය වශයෙන් හුවමාරු විය හැකිය.

3.1 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක භූමිකාවන් සහ වගකීම්

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් සඳහා මෙහෙයුම් වගකීම් සීමා නිර්ණය කරමින් පහත සඳහන් මෙහෙයුම් භූමිකාවන් විස්තර කර ඇත.

3.1.1 සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරකවරුන් (SAR Mission Coordinators)

සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක ස්ථානය අනුව, සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සිදු කිරීම සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක නම් කිරීම, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) හෝ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ( MRCC) විසින් කරනු ලැබේ. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමේ සියලුම අදියර ක්‍රියාත්මක කිරීම සඳහා සහ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක්, පවතින සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් භාවිතයෙන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක වගකිව යුතුය. සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක වෙත පවතින වගකීම් සඳහා, සුදුසු සහ ප්‍රමාණවත් සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් කඩිනමින් යැවීම සහ මුදවා ගැනීම අවසන්වන තුරු හෝ එම මෙහෙයුම් සාර්ථක වීමේ අවස්ථා සඳහා තවදුරටත් සාධාරණ හැකියාවක් නොපවතින තෙක් සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

3.1.2 සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධතා සම්බන්ධීකාරක (SAR Liaison Coordinator)

සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම අනුව, එක් එක් සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකවල තිබෙන වත්කම් හෝ සැපයුම්, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක වෙත සම්බන්ධීකරණය කරන්නා වූ, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ (ARCC) හෝ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ (MRCC) ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධතා සම්බන්ධීකාරක විය යුතුය.

3.1.3 ස්ථානීය සම්බන්ධීකාරකවරුන් (On – Scene Coordinators)

ස්ථානීය සම්බන්ධීකාරකවරයා (OSC) වන්නේ, සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් සඳහා සිද්ධිය සිදු වූ ස්ථානයට යොදවන වඩාත්ම ජ්‍යෙෂ්ඨ සහ දක්ෂ පුද්ගලයා වේ. සාමාන්‍යයෙන් සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකයක අණදෙන නිලධාරී/භාර නිලධාරියා, ස්ථානීය සම්බන්ධීකාරක ලෙස සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරකවරයා (SMC) විසින් නම් කරනු ලැබේ. සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් ගණනාවක් එකම ස්ථානයක එකම සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක් සඳහා එක්ව ක්‍රියා කරන විට, සහභාගී වන සියලුම වත්කම්වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා එක් ඒකකයක් වෙත පැවරීම වාසිදායක විය හැක.

ස්ථානීය සම්බන්ධීකාරකවරයා (OSC) වන්නේ, සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධයෙන් විශේෂිත පුහුණුවක් සහිත, එම පුද්ගලයා රැඳී සිටින සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකයට අඛණ්ඩ සන්නිවේදන සම්බන්ධතාවය පවත්වා ගැනීමට හැකියාව ඇති, යෙදී සිටි සෙවීම් ප්‍රදේශය තුළ වැඩිම වේලාවක් රැඳී සිටිමින් , සෙවීම් සහ මුදවා ගැනීම් කටයුතු කළ හැකි, සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකයක ප්‍රධාන නිලධාරියායි.

3.2 සෙවීම් සහ මුදවා ගැනීමේ ප්‍රතිචාරයක අදියර

3.2.1 සෙවීම් සහ මුදවා ගැනීම් සිද්ධියකට ප්‍රතිචාර දැක්වීම සාමාන්‍යයෙන් අදියර පහක අනුපිළිවෙලට සිදු වේ.

3.2.2 මෙම අදියරයන් සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය විසින් සාමාන්‍යයෙන් සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමකට ප්‍රතිචාර දැක්වීමේ දී, සිද්ධිය පිළිබඳව පද්ධතිය දැනුවත් වූ මොහොතේ සිට, සිද්ධිය සම්බන්ධයෙන් එහි ප්‍රතිචාරය අවසන්වන තුරු සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සමූහයකි.

3.2.3 නිශ්චිත සෙවීම් සහ මුදවා ගැනීම් සිද්ධියකට ප්‍රතිචාර දැක්වීම සඳහා පිළිවෙලින් සෑම අදියරක්ම පසු කිරීම අවශ්‍ය නොවනු ඇත. සමහර සිදුවීම් සඳහා, එක් අදියරක ක්‍රියාකාරකම් තවත් අදියරක ක්‍රියාකාරකම් සමග සමපාත විය හැකිය, එනම් අදියර දෙකක හෝ වැඩි ගණනක කොටස් එකවර සිදු කිරීම කළ හැක.

3.2.4 සෙවීම් සහ මුදවා ගැනීම් අදියර පහ වන්නේ:

a) දැනුවත් වීම (Awareness)

සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතියේ ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් හදිසි තත්වයක් පවතින හෝ පැවතිය හැකි බව දැන ගැනීම.

b) මූලික ක්‍රියාව (Initial Action)

සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් සඳහා අදාළ දැනුවත් කිරීම සඳහා ගෙන ඇති මූලික ක්‍රියා මාර්ග සහ සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීම. මෙම අදියර තුළ සිද්ධිය සම්බන්ධයෙන් ලැබී ඇති, තොරතුරු ඇගයීම සහ වර්ගීකරණය, සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් සඳහා අදාළ දැනුවත් කිරීම, සන්නිවේදන සම්බන්ධතා පරීක්ෂා කිරීම සහ හදිසි අවස්ථාවලදී, වෙනත් අදියරවලින් දක්වා ඇති සුදුසු ක්‍රියාකාරකම් ක්ෂණිකව ක්‍රියාත්මක කිරීම ඇතුළත් විය හැකිය.

c) සැලසුම් කිරීම (Planning)

දිවි ගලවා ගත් පුද්ගලයින් සෙවීම, මුදවා ගැනීම සහ අවසාන වශයෙන් දිවි ගලවා ගත් පුද්ගලයින් වෛද්‍ය පහසුකම් හෝ වෙනත් ආරක්ෂිත ස්ථාන වෙත සුදුසු පරිදි භාරදීම සඳහා අදාළ සැළසුම් ඇතුළු මෙහෙයුම් සැලසුම් කිරීම.

d) මෙහෙයුම් සිදුකිරීම (Operations)

සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් අදාළ ස්ථානයට යැවීම, සෝදිසි කිරීම් සිදු කිරීම, දිවි ගලවා ගත් පුද්ගලයින් බේරා ගැනීම, විපතට පත් ගුවන් යානාව සඳහා සහාය ලබා දීම, දිවි ගලවා ගත් පුද්ගලයින් සඳහා අවශ්‍ය හදිසි ප්‍රතිකාර ලබා දීම සහ තුවාලකරුවන් සඳහා වෛද්‍ය පහසුකම් ලබා දීම.

e) අවසානය (Conclusion)

සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් අවසානයේ ඒවා නියමිත කර ඇති ස්ථානයට ආපසු යැවීම, අවශ්‍ය සියලුම ලියකියවිලි සම්පූර්ණ කොට සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් ඒවායේ සුපුරුදු ක්‍රියාකාරකම් සඳහා ආපසු ලබා දීම.

3.3 සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතිය දැනුවත් කිරීම සහ හදිසි අවස්ථා

3.3.1 ගුවන් යානා හදිසි අවස්ථා තුන (Three Phases)

3.3.1.1 ගුවන් යානා හදිසි අවස්ථා සිදුවීම් වර්ගීකරණය කිරීම සහ එක් එක් විශේෂිත සිදුවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා ගුවන් යානා හදිසි අවස්ථා තුනක් ස්ථාපිත කර ඇත.

3.3.1.2 හදිසි අදියර, ඒවා ප්‍රගමනය අනුපිළිවෙලට:

| | |
|---|---|
| අවිනිශ්චිතතා අවධිය (Uncertainty Phase) | INCERFA |
| අනතුරු ඇඟවීමේ අවධිය (Alert Phase) | ALERFA |
| ආපදා අවධිය (Distress Phase) | DETRESFA |

3.3.1.3 හදිසි අවස්ථා වර්ධනයවන ආකාරය අනුව, අනුපිළිවෙලින් නොවුනත් එයට ගැළපෙන හදිසි අදියරට අනුකූලව ක්‍රියා මාර්ග ගත හැකිය.

3.3.1.4 සිදුවීමක් සම්බන්ධව ලැබෙන සියලුම වාර්තා, ඒවායේ වලංගුභාවය, මෙහෙයුම සඳහා ඇති ප්‍රමුඛතාව සහ අවශ්‍ය මෙහෙයුමේ සීමාවන් තීරණය කිරීම සඳහා ප්‍රවේශමෙන් ඇගයීමට ලක්කළ යුතුය.

3.3.1.5 මෙම හදිසි අවස්ථා තුනෙන් එක් එක් අවස්ථා සඳහා, සුදුසු අවශ්‍යවන හදිසි අවස්ථාව සහතික කරන සිදුවීම්වල තත්වයන්, එහිදී සෙවීම් සහ මුදවා ගැනීම් ආයතන මගින් අනුගමනය කළ යුතු ක්‍රියා අනුපිළිවෙල සමග, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC), සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) සහ සියලුම සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකයන්හි සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් අත්පොත්වල, පැහැදිලිව විස්තර කළ යුතුය.

3.4 සෙවීම් සහ මුදවා ගැනීම් සැලසුම් සහ මෙහෙයුම් :

සෙවීම් සැලසුම් කිරීම, මුදවා ගැනීම් සැලසුම් කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ විස්තරාත්මක ක්‍රියා පටිපාටි, අන්තර්ජාතික ගගන නාවික සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් (IAMSAR) අත්පොතට අනුකූලව ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයන්හි (MRCC), සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් අත්පොත්වලට ඇතුළත් කළ යුතුය.

3.5 සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් අත්හිටුවීම හෝ අවසන් කිරීම

3.5.1 සිදුවීම සඳහා වගකිවයුතු සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය, (ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ පරිදි) ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම අත්හිටුවිය යුත්තේ කවදාද, කුමන මොහොතේදීද යන්න තීරණය කරයි.

3.5.2 දිවි ගලවා ගත් අය බේරා ගැනීම සඳහා පවතින සාධාරණ බලාපොරොත්තු තත්වයන් පහව යන තෙක් සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් දිගටම කරගෙන යා යුතුය.

3.5.3 සෙවීම් පිළිබඳ සම්පූර්ණ සමාලෝචනයක් සිදු කරන තුරු, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක් අත්හිටුවීමට හෝ අවසන් කිරීමට තීරණයක් ගනු නොලැබේ.

3.5.4 සෙවීම් පිළිබඳ සමාලෝචනය පහත සම්භාවිතාවන් කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

1) මුල් සිද්ධියෙන් දිවි ගලවා ගත් අය සිටීම,
2) සිද්ධියෙන් පසු දිගටම සිදුවීමට භාජනය වූ අයවලුන් / පැවතීමේ හෝ ජීවත්වීමේ හැකියාව,
3) දිවි ගලවා ගත් අය සෝදිසි කලාපයේ/ සෙවුම් ප්‍රදේශයේ සිටි බවත්, සහ
4) සෝදිසි මෙහෙයුම සාර්ථක වන මට්ටම.

3.5.5 සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය විසින්, සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම සාර්ථක වී ඇති බවට පවතින විශ්වාසදායක තොරතුරු මත හෝ හදිසි අවස්ථාව තවදුරටත් නොපවතින බව තහවුරු වී ඇති විට, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම අවසන් කළයුතු අතර, ඒ පිළිබඳව ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව (NASC) වෙත සහ දැනුවත් කර ඇති හෝ සක්‍රිය කර ඇති වෙනත් අදාළ පහසුකම් හෝ සේවාවන් වෙත වහාම දැනුම් දිය යුතුය.

3.5.6 සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුමක් අඛණ්ඩව කරගෙන යාම, පවතින තත්ත්වයන් සහ අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ප්‍රායෝගික නොවන්නේ නම් සහ දිවි ගලවා ගත් අය තවමත් ජීවතුන් අතර සිටිය හැකි බවට අදාළ සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය නිගමනය කරන්නේ නම්, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක (SMC) විසින් සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවිය හැකිය. පසුව ලැබුණු තොරතුරු ඇගයීමට ලක්කර සාධාරණීකරණය කළ පසු, එවැනි තොරතුරු මත පදනම්ව මෙහෙයුම් නැවත ආරම්භ කළ යුතුය.

3.6 සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීම් ලේඛනගත කිරීම

3.6.1 අදාළ සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරන ලද හෝ ප්‍රතිචාර දක්වන ලද සියලුම සිද්ධීන් ලේඛනගත කිරීම සඳහා එම සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය විසින් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. එම ලේඛන වසර 10 ක කාලයක් සඳහා තොරතුරු මූලාශ්‍ර ලෙස සුරක්ෂිතව තබා ගත යුතුය. සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරන ලද හෝ ප්‍රතිචාර දක්වන ලද සියලුම සිදුවීම්වල සංඛ්‍යාන දත්ත සහ වාර්තා සඳහා මහජනතාව වෙත ප්‍රවේශය ලබා දිය යුතුය.

**4 ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගිතාව**

4.1 සෙවීම් සහ මුදවා ගැනීම් ගිවිසුම්

4.1.1 විදේශීය දේශ සීමා තුළ හෝ මුහුදු සීමා තුළ සිදුවන සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා ආධාර සහ සහයෝගය ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති, ජීවිත සුරැකීම මෙන්ම, ස්වෛරීභාවය සහ ජාතික ආරක්ෂාව වැනි කරුණු සමග තුලනාත්මකව සැළකිය යුතුය.

4.1.2 විදේශ කටයුතු අමාත්‍යාංශයේ පූර්ව උපදෙස් නොමැතිව එවැනි ජාත්‍යන්තර ගිවිසුමක් අත්සන් කිරීම හෝ එසේ නොමැති නම් ජාත්‍යන්තර ගිවිසුමක් සඳහා අවසාන නිගමනයකට එළඹීම සිදු කළ නොහැක.

4.1.3 ශ්‍රී ලංකාව තුළ පවතින ආයතන හෝ සංවිධාන සමග ඇති කර ගන්නා වූ ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා වන ගිවිසුම් හෝ වෙනත් රාජ්‍යයන් සමග හෝ ජාත්‍යන්තර ආයතන සමග ඇති කර ගන්නා එවැනි ගිවිසුම්, පහත දැක්වෙන ආකාරයට සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා ප්‍රායෝගික තත්ත්වයන් එක් කරනු ඇත.

- ශ්‍රී ලංකාවේ දේශීය වගකීම් සහ අවශ්‍යතා සපුරාලීමට උපකාර කිරීම;
- පවතින සියලුම සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් හෝ සැපයුම් වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීමේ හැකියාව;
- ගෝලීය සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතියන්ට, ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන් වඩා හොඳින් ඒකාබද්ධ කිරීම;
- ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සඳහා සහය දැක්වීමට අවශ්‍ය අන්‍යෝන්‍ය කැපවීම ගොඩනැගීම;
- කාලය තීරණාත්මක සාධකයක් වන ආපදා තත්ත්වයන්ට පෙර, සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියා පටිපාටි සහ සංවේදී කරුණු විසඳීම; සහ
- සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍යවන සහාය සහ සහයෝගීතාවන් හඳුනා ගැනීම. (එනම්, වෛද්‍ය සහාය හෝ ඉන්ධන සපයා ගැනීම් වැනි පහසුකම් සඳහා ප්‍රවේශය, පුහුණුවීම් සහ අභ්‍යාස සඳහා සහයෝගීතාව, තොරතුරු හුවමාරුව, සන්නිවේදන හැකියාවන් භාවිතය සහ ඒකාබද්ධ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති ආදිය)

4.1.4 එවැනි ගිවිසුම් සාකච්ඡා කිරීම සහ නිගමනයන්ට එළඹීම සඳහා පහත කරුණු සලකා බැලිය යුතුය:

- ගිවිසුමට සම්බන්ධ විය යුත්තේ රජයේ කුමන අධිකාරීන් ද , නියෝජිත ආයතන හෝ සංවිධාන ද යන වග;
- ජාත්‍යන්තර සහ දේශීය සිවිල් සෙවීම් සහ මුදවා ගැනීම් මූලධර්ම හෝ ප්‍රතිපත්ති සමඟ අනුකූල වීම;
- නව ගිවිසුමක් සකස් කිරීමේදී, සළකා බැලිය යුතු හෝ එමගින් ආදේශනය වන වෙනත් ගිවිසුම්, තිබේද; යන වග සහ
- අන්තර්ජාතික ගගන නාවික සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් (IAMSAR) අත්පොත, ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම සහ අනෙකුත් අදාළ නියෝගවල මාර්ගෝපදේශයන්.

4.1.5 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධයෙන් කිසියම් ගිවිසුමක් සකස් කිරීම සඳහා සහභාගීවන ආයතන, එවැනි කාරණා ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශව සමඟ සම්බන්ධීකරණය කර ඇති බවට සහතික විය යුතුය.

4.2 අසල්වැසි රාජ්‍යයන්ගේ සෙවීම් සහ මුදවා ගැනීම් අධිකාරියන් සමඟ සහයෝගීතාවය

4.2.1 සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් ප්‍රදේශය, ජාත්‍යන්තර සෙවීම් සහ මුදවා ගැනීම් කලාප මායිමට ආසන්නව හෝ මායිම හරහා ඇති විට, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට සහ වෙළඳ නාවික ලේකම් කාර්යාලයට දැනුම් දිය යුතුය. එසේ දැනුම් දුන් විට, දැනට ස්ථාපිතව ඇති සෙවීම් සහ මුදවා ගැනීම් සැකසුම් වලට අනුකූලව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින්, විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා, අසල්වැසි රාජ්‍යවල, ස්ථාපිත සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ වී, මෙම මෙහෙයුම සඳහා සමස්ථ සම්බන්ධීකරණය භාර ගැනීමට හොඳින්ම ස්ථානගත වී ඇති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය තෝරාගෙන එම රාජ්‍යය සහ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමග ඉදිරි කටයුතු සඳහා සම්බන්ධ වනු ඇත.

පහත දැක්වෙන ක්‍රියාපටිපාටින්, සෙවීම් සහ මුදවා ගැනීම් සීමාවන් හරහා හෝ සීමාවන්ට ආසන්නව, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීමේදී, ජාත්‍යන්තරව එකඟ වූ ප්‍රවේශයන් පිළිබිඹු කරනු ඇත.

4.2.2 විපතට පත් ගුවන්යානය පිහිටි ස්ථානය දැනගත් විට, සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියාව ආරම්භ කිරීමේ වගකීම අනතුරට පත් ගුවන් යානය පිහිටි ස්ථානයට අදාළ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයෙහි, සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සතුවේ.

4.2.3 විපතට පත් ගුවන් යානයේ පිහිටීම නොදන්නා විට, සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියාවක් මෙහෙයවීම සඳහා වගකීම භාර ගන්නා ජාත්‍යන්තර සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වනුයේ පහත වගකීම සහිත සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයයි:

- ➢ යානය අවසන්වරට වාර්තා කළ ස්ථානයට අනුව, යානය පියාසර කරමින් තිබූ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය; හෝ
- ➢ අවසන්වරට වාර්තා කරන ලද ස්ථානය, සෙවීම් සහ මුදවා ගැනීම් කලාප දෙකක මායිමේ නම්, එසේ වාර්තා කිරීමෙන් පසුව යානය ඇතුලුවන සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය; හෝ
- ➢ යානය ගොඩ බස්සන්නට සුදුසු, ද්විත්ව-සම්බන්ධීකරණ ගුවන් විදුලි සන්නිවේදන උපකරණ වලින් සමන්විත නොවූයේ නම් හෝ ගුවන් විදුලි සන්නිවේදනය පවත්වා ගැනීමට බැඳී නොසිටින්නේ නම් එම යානය නියමිත ස්ථානයට අදාළවන සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය.

4.2.4 සෙවීම් සහ මුදවා ගැනීම් ක්‍රියාවක් ආරම්භ කිරීමෙන් පසුව, සිද්ධියට අදාළ ප්‍රදේශය, යාබද සෙවීම් සහ මුදවා ගැනීම් කලාප දෙකක හෝ වැඩි ගණනක සීමාවන් හරහා පිහිටා ඇති බව තීරණය කරන්නේ නම්, සාමාන්‍යයෙන්, ආරම්භක සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වගකිව යුතු සෙවීම් සහ මුදවා ගැනීම් අධිකාරිය ලෙස පවතී.

4.2.5 ඉහත 4.2.4 දැක්වූ සැකසුමට විකල්පයක් ලෙස, සෙවුම් ප්‍රදේශය පුළුල් වන විට, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හෝ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයෙහි සෙවීම් ප්‍රයත්න සම්බන්ධීකරණය කළ හැකි අතර, යාබද ජාත්‍යන්තර සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින්, ඔවුනගේ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය තුළ, සෙවීම් ප්‍රයත්නය සම්බන්ධීකරණය කළ හැක්කේය.

මෙය වඩාත් සුදුසු උපාය මාර්ගය නම්, ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හෝ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින්, යාබද සුදුසු ජාත්‍යන්තර සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත මෙම යෝජනාව කළ හැකි වන්නේය.

4.3 සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වලදී විදේශීය ගුවන් යානා ඇතුල්වීමේ විධිවිධාන

4.3.1 සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම්වල යෙදී සිටින විදේශීය ගුවන් යානා, ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය වෙත ඇතුළුවීම සහ පිටවීම සංවිධානය කිරීමේ වගකීම විදේශ කටයුතු අමාත්‍යාංශය භාරගත යුතුය. වෙනත් සෙවීම් සහ මුදවා ගැනීම් අධිකාරියක්, ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයේ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සිදු කිරීමට විදේශීය ගුවන් යානයකට පැවරීම පිළිබඳව දැනුවත් වුවහොත්, ඒ සඳහා අවශ්‍ය පරිදි අනුමැතිය සහ රාජ්‍යතාන්ත්‍රික අවසරයන් සංවිධානය කිරීම සඳහා වහාම විදේශ කටයුතු අමාත්‍යාංශයට දැනුම් දිය යුතුය.

4.4 විදේශීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයන් විසින් සහාය පතා කරන ඉල්ලීම්

4.4.1 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් අධිකාරිය ලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් හෝ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් අධිකාරිය ලෙස වෙළඳ නාවික ලේකම් කාර්යාලයෙන් හෝ, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් හෝ, සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකාවට අවශ්‍ය සහාය ලබාදීමට ජාත්‍යන්තර සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානයන් වෙතින් ඉල්ලුම් ලැබිය හැක.

වෙනත් ජාත්‍යන්තර ආයතනයන් මගින් සහාය සඳහාවන ඉල්ලීමක්, සමුද්‍රීය හෝ ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් අධිකාරියන්ගෙන් කරන ලද හෝ එම අධිකාරියන් විසින් සිදුවීම් සිදු වූ ප්‍රදේශයට අයත් වන සෙවීම් සහ මුදවා ගැනීම් මධ්‍යස්ථානය සමග ඍජු සන්නිවේදනය ස්ථාපිත කොට, අවශ්‍ය වන සහාය ලබා දීමට ක්‍රියා කළ හැක. මෙවන් අවස්ථාවකදී, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය ද සමගාමීව දැනුවත් කිරීම, අවශ්‍ය සහාය ලබාදීම මෙන්ම ප්‍රමුඛතාවයෙන් යුතුව, අදාළ අධිකාරිය විසින් කළ යුතු වන්නේය.

5. පුහුණුව සහ අභ්‍යාස

5.1 සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකාරක සහ ප්‍රතිචාර දක්වන්නන්ගේ පුහුණු අවශ්‍යතා

5.1.1 සමාලෝචනය (Overview)

5.1.1.1 හදිසි අවස්ථාවලට මුහුණදීමට සැළසුම් කිරීමේදී හා සූදානම්වීමේදී, සෙවීම් සහ මුදවා ගැනීම් කාර්යයන්වල නිරත පුද්ගලයින් පුහුණු කිරීම අත්‍යාවශ්‍යයෙන්ම කළයුතු කාර්යයක් වන්නේය. සෙවීම් සහ මුදවා ගැනීම් කාර්යයන්ට සම්බන්ධ පුද්ගලයින් ස්ථාපිත මූලික පදනමකට අනුව පුහුණු කළ යුතුය. ඒ සඳහා පහත මූලික විෂයයන් ඇතුළත් විය යුතුය:

- ➢ සංචලනය (Navigation);
- ➢ ප්‍රස්ථාරගත කිරීම (Charting);
- ➢ ප්ලාවිත න්‍යාය (Drift Theory); සහ
- ➢ සෙවීම් සහ මුදවා ගැනීම් රටා (SAR Patterns).

5.1.1.2 සෙවීම් සහ මුදවා ගැනීම් කාර්යයකදී ඔවුන්ගේ වගකීම් සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් පුහුණුවක් ඔවුන්ට තිබිය යුතුය.

5.1.1.3 කළමනාකරණ මට්ටමේ සිට උපකරණ ක්‍රියාකරු මට්ටම දක්වා, කණ්ඩායම තුළ, ඔවුන්ගේ නිශ්චිත වගකීම්වලට සරිලන ආකාරයට පුහුණුවක් ලැබිය යුතුය.

5.1.2 සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකාරක පුහුණුව (SAR Coordinator Training)

5.1.2.1 සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙවර සම්බන්ධීකාරකවරුන් (SAR Mission Coordinators) සහ සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරීන් (SAROs), (ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) සහ ශ්‍රී ලංකා නාවික හමුදාව (SLN), තම කාර්ය මණ්ඩලයන් සඳහා ශ්‍රී ලංකා රජය විසින් නියමකර ඇති රෙගුලාසිවලට අදාළව, පාඨමාලා පවත්වා ඔවුන් ඒ සඳහා සහතික කළ යුතුය.

5.1.2.2 අන්තර්ජාතික ගගන නාවික සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් (IAMSAR) අත්පොත, වෙළුම (volume) 1, තෙවන පරිච්ඡේදයට අනුව සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයන් හි සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් ලෙස පුහුණු කළ යුතුය.

5.1.3 සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාර දක්වන්නා සඳහා පුහුණුව (SAR Responder Training)

5.1.3.1 සෙවීම් සහ මුදවා ගැනීම් සඳහා ප්‍රතිචාර දක්වන්නන් හට ලබාදෙන පුහුණුව, පහත සඳහන් මාතෘකාවන්ට අදාළව සැපයිය හැක.

ජාතික සහ ජාත්‍යන්තර සෙවීම් සහ මුදවා ගැනීම් සංවිධාන ව්‍යුහය සහ ස්ථානීය වගකීම් පිළිබඳ සමාලෝචනය;

- ➢ සිද්ධි ක්‍රියාකාරී සැලසුම් (Incident Action Plans) සහ සැලසුම් ක්‍රියාවලි චක්‍රය (Planning Process Cycle);
- ➢ උපාය මාර්ගික මෙහෙයුම් සැලසුම් කිරීම (Tactical Operations Planning);
- ➢ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්ම (NASARP) හඳුන්වාදීම;
- ➢ හදිසි ප්‍රතිචාර සංවිධාන ව්‍යුහය සහ රාජකාරි (Emergency response organization structure & duties);
- ➢ වාර්තා කිරීමේ පටිපාටියන්, අවශ්‍යතාවයන් සහ ප්‍රතිපාදනයන්, වගකීම් (Reporting procedures, requirements, & responsibilities);
- ➢ සෙවීම් සහ මුදවා ගැනීම් ප්‍රතිචාරය අතරතුර සන්නිවේදන ක්‍රියා පටිපාටි (Communications procedures during SAR response);
- ➢ හෙලිකොප්ටර් යොදාගෙන කරන මෙහෙයුම්වලදී, ආරක්ෂාව සහතික කිරීම සඳහා සැළකිලිමත් විය යුතු, පුද්ගල ආරක්ෂාව, අභ්‍යන්තර පැටවීම් මූලධර්ම (internal loading) , කඹයන් හෝ දම්වැල්, හෙලිකොප්ටරයෙන් පහත හෙලා කරන මෙහෙයුම (Slinging Operation), හස්ත සංඥා (hand signals) සහ ගුවන් විදුලි සන්නිවේදනය (radio communication);
- ➢ කුඩා බෝට්ටු යොදා කරන මෙහෙයුම්වලදී ආරක්ෂිත වැඩ පිළිවෙත් (safe working practices on small boats);
- ➢ ප්‍රථමාධාර (First aid) ; සහ
- ➢ ලැබෙන තොරතුරුවල රහස්‍යභාවය සහ මාධ්‍ය සාකච්ඡා මගින් අත්‍යාවශ්‍ය තොරතුරු ජනමාධ්‍ය වෙත ලබාදීම (Confidentiality of information and discussion with the media).

5.2 ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මේ භාවිතය

5.2.1 කලින් සැලසුම් කරන ලද තත්ත්ව යටතේ (under simulated conditions) කරන්නා වූ සෙවීම් සහ මුදවා ගැනීම් අභ්‍යාස (SAREXS), ජාතික ගගන නාවික සැලැස්මේ පරිපූර්ණත්වය සහ සඵලතාවය ඇගයීමට ලක් කරයි. මෙම අභ්‍යාසයන් තුළින්, අවශ්‍ය සම්බන්ධතාවයන් ගොඩනැගීම, සම්බන්ධීකරණ කුසලතාවයන් වර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික අත්දැකීම් සපයනු ඇත. යථාර්ථවාදී පදනමක් මත පවත්වනු ලබන අභ්‍යාස, පුහුණුවේ සැබෑ සඵලතාවය සහ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් පද්ධතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ නිපුණතාවය ප්‍රදර්ශනය කිරීමට සහ තක්සේරු කිරීමට උපකාරී වේ. මෙම අභ්‍යාස මගින් ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සැලැස්මේ පැවතිය හැකි අඩුපාඩු අනාවරණය කර ඒවා වැඩිදියුණු කිරීමට හැකියාව ලැබේ.

5.2.2 හැකියාව පිළිබඳ පරීක්ෂා කිරීමට ඇති වැදගත් අංග වන්නේ;

- ප්‍රායෝගිකත්වය (ව්‍යුහය සහ සංවිධානය);
- සන්නිවේදන;
- උපකරණ හැසිරවීමේ හැකියාව සහ ප්‍රතිචාර කාලය;
- ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රමාණවත් බව; (Adequacy of the Action Plan)
- මහජන ආයතන සහ මාධ්‍ය සම්බන්ධතා

5.2.3 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයත්, සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයත් තමන්ගේ හැකියාවන් ඇගයීම සඳහා සහ අවශ්‍ය පරිදි වැඩිදියුණු කිරීම සඳහා වරින් වර පුහුණුවීම් සහ අභ්‍යාස පැවැත්විය යුතුය.

5.2.4 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව, සෙවීම් සහ මුදවා ගැනීම් වගකීම් සහිත ආයතන සහ සම්බන්ධීකරණ ආයතනවල කාර්ය සාධනය ඇගයීම සඳහා ජාතික සෙවීම් සහ මුදවාගැනීමේ අභ්‍යාසයක් (SAREX) වාර්ෂිකව සැලසුම් කොට පැවැත්විය යුතුය. ඉහත මධ්‍යස්ථානයන් මගින් ජාතික සෙවීම් සහ මුදවාගැනීමේ අභ්‍යාස (SAREX) ඇගයීම, අධීක්ෂණය සහ විගණනය කිරීම සඳහා අපක්ෂපාතී යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය.


5.2.5 ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව සෙවීම් සහ මුදවාගැනීමේ අභ්‍යාස (SAREX) පිළිබඳ විස්තර ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටු රැස්වීමට, සමාලෝචන සහ නිර්දේශිත ඇගයීම් සහිතව ඉදිරිපත් කළ යුතුය.

5.2.6 සලකා බැලිය යුතු අභ්‍යාසයන් වන්නේ:


- සෙවීම් සහ මුදවා ගැනීම් සිදුවීමක් අතරතුර (අනෙකුත් රාජ්‍ය, රාජ්‍ය නොවන සහ දෙපාර්තමේන්තු නිලධාරීන් ඇතුළුව) සහභාගී වන හෝ සම්බන්ධ කර ගන්නා පිරිස් කැඳවීම; සහ
- Table Top අභ්‍යාසයන්, ක්‍රියාකාරී අභ්‍යාසයන් (Functional Exercise) සහ සම්පූර්ණ පරිමාණයෙන් කරන බහු නියෝජිත අභ්‍යාස (Full Scale Exercise)

5.2.7 සෙවීම් සහ මුදවා ගැනීම් වත්කම් භාවිත කරමින් කරන සෙවීම් සහ මුදවා ගැනීම් අභ්‍යාසයන් (SAREXs), සමුද්‍රයේ හෝ ගොඩබිමෙහි, සිදු වන සත්‍ය සිද්ධියක් වශයෙන් කළ හැකිය. එම අවස්ථාවලදී, තිබෙන ප්‍රායෝගික තත්ත්වයන් සළකා සෙවුම් රටා (Search Patterns) සහ සෙවීම් සහ මුදවා ගැනීම් ශිල්පීය ක්‍රම (SAR Techniques) පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දිය හැකි වනු ඇත.

**ඇමුණුම 1: ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR)**



රූපය 3: කලාපීය සෙවීම් සහ මුදවා ගැනීම් කලාප (SRR)




*රූපය 4 : ශ්‍රී ලංකා සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR)*

කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR)/ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය (SRR) මායිම් :

100000N 0800000E -100000N 0820000E

060000N 9200000E -020000S 0920000E

020000S 0780000E - 060000N 0780000E

**ඇමුණුම 2: සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC), ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) සහ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුවේ (NASC) ඇමතුම් විස්තර :**

a) සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC), ශ්‍රී ලංකාව
දුරකථන: +94 11 2445368
කොළඹ ගුවන් විදුලිය 02 දුරකථන (Colombo Radio 02): +94 112423645
කොළඹ ගුවන් විදුලි ෆැක්ස් +94 112424651
DGO WTR කාර්යාලය ටෙලි ෆැක්ස් : +94 11 2441454
විද්‍යුත් තැපැල (E-mail):
mrcccolombo@gmail.com
nhqdno@yahoo.com

b) ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC), ශ්‍රී ලංකාව
ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC)
ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,
කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ,
රත්මලාන,
ශ්‍රී ලංකාව.

දුරකථන:
+94 11 2 625555
+94 11 2 611572
+94 11 2 634444
+94 11 2 623030 *Ext* : 666 / 259 / 250
විද්‍යුත් තැපැල (Email):
arcccolombo@airport.lk
acc.ans@airport.lk
ෆැක්ස්:
+94 11 2 635106

ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC)
භාර නිලධාරී සම්බන්ධතා විස්තර:

විද්‍යුත් තැපැල (Email):
smsar.ans@airport.lk
kiriatc.ans@airport.lk
දුරකථන: +94 76 824 2730
ෆැක්ස් : +94 11 2 635105 (කාර්යාල වේලාවන් තුළ)

c) ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ
දුරකථන:
+94 11 2381154
+94 11 2541 529
විද්‍යුත් තැපැල (Email): secdefence@defence.lk

d) වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය
ලේකම්, වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01
දුරකථන: +94 112 439 352
විද්‍යුත් තැපැල (Email): secretary@portmin.gov.lk

e) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
අංක 152/1, මිනුවන්ගොඩ පාර (රේඩාර් කුළුණ ඉදිරිපිට), කටුනායක, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 112 358 802, +94 11 2252017
විද්‍යුත් තැපැල (Email): sldgca@caa.lk

f) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ලේකම් කාර්යාලය
කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථනය : +94 112 484 500, +94 112 484 600, +94 112 484 700
ෆැක්ස් : +94 112 449 823
විද්‍යුත් තැපැල (Email): info@mo.treasury.gov.lk

g) සෞඛ්‍ය අමාත්‍යාංශය
ලේකම්
සුවසිරිපාය, අංක 385,
පූජ්‍ය. බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන (සාමාන්‍ය):
+94112 694033, +94112 675011,
+94112 675449, +94112 693493

h) විදේශ කටයුතු අමාත්‍යාංශය
ලේකම්
ජනරජ ගොඩනැගිල්ල,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01,
ශ්‍රී ලංකාව.
දුරකථන (සාමාන්‍ය)
+94 112 325372, +94 112 325373, +94 112 325375
විද්‍යුත් තැපැල (Email): cypher@mfa.gov.lk

i) ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම.
සභාපති
ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම.
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ,
කටුනායක,
ශ්‍රී ලංකාව.
දුරකථන : +94 112 264444
විද්‍යුත් තැපැල (Email): chairman@airport.lk & comments@airport.lk

j) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
අධ්‍යක්ෂ ජනරාල්
විද්‍යා මාවත, කොළඹ 07
දුරකථන (සාමාන්‍ය): +94 112 136 136, හදිසි : +94 112 136 222 / +94 112 670 002
විද්‍යුත් තැපැල(Email): dg@dmc.gov.lk

k) ධීවර අමාත්‍යාංශය
ලේකම්
නව ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10
දුරකථන: +94 112 327 060
විද්‍යුත් තැපැල (Email): secfisherieslk@gmail.com

**කෙටි යෙදුම්**

AASL - Airport & Aviation Services (Sri Lanka) (Pvt) Ltd / ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
AIP - Aeronautical Information Publication / ගගන නාවික තොරතුරු ප්‍රකාශනය
ARCC - Aeronautical Rescue Coordination Centre / ගගන නාවික සෙවීම් මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
CAASL - Civil Aviation Authority of Sri Lanka / ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
DGCA - Director General of Civil Aviation / සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
ELT - Emergency Locator Transmitter / හදිසි ස්ථානගත සම්ප්‍රේෂකය
IAMSAR - International Aeronautical and Maritime Search and Rescue / අන්තර්ජාතික ගගන නාවික සහ සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම්
ICAO - International Civil Aviation Organization / ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය
MRCC - Maritime Rescue Coordination Centre / සමුද්‍රීය සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
MRO - Mass Rescue Operation / සමූහ මුදවා ගැනීමේ මෙහෙයුම්
NOTAM - Notice to Airmen / පියාසැරි මෙහෙයුම් සම්බන්ධ පුද්ගලයින්ට අත්‍යවශ්‍ය තොරතුරු අඩංගු දැන්වීම
NASC - National Aeronautical Search and Rescue Committee / ජාතික ගගන නාවික සෙවීම් සහ මුදවා ගැනීම් කමිටුව
RCC - Rescue Coordination Centre / මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
RSC - Rescue Sub Centre / මුදවා ගැනීම් උප මධ්‍යස්ථානය
SAR - Search and Rescue / සෙවීම් සහ මුදවා ගැනීම්
SARO - Search and Rescue Officer / සෙවීම් සහ මුදවා ගැනීම් නිලධාරී
SAREX - Search and Rescue Exercise / සෙවීම් සහ මුදවා ගැනීම් අභ්‍යාස
SCPP - SAR Capability Partnership Programme / සෙවීම් සහ මුදවා ගැනීම් හැකියා හවුල්කාරිත්ව වැඩසටහන
SMC - SAR Mission Coordinator / සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකාරක
SRR - Search & Rescue Region / සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය
SRU - Search and Rescue Unit / සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකය
UTC - Coordinated Universal Time / විශ්වීය්‍ය සම්බන්ධීකාරක කාලය

**පදමාලාව**

මෙම ලේඛනයේ පහත සඳහන් යෙදුම් භාවිතා කරන විට, ඒ සඳහා පහත අර්ථයන් දැක්වෙනු ඇත;

**අනතුර:** කිසියම් පුද්ගලයෙකු පියාසර කිරීමේ චේතනාවෙන් ගුවන් යානයට ගොඩවන වේලාවත්, එවැනි සියලු පුද්ගලයින් බැස යන තෙක් අතර සිදු වන ගුවන් යානයක ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සිදුවීමක්,

a) පහත හේතු මත පුද්ගලයෙකු මාරාන්තික හෝ බරපතල තුවාල ලබා ඇති විට,

- ගුවන් යානය තුළ සිටීම ; හෝ
- ගුවන් යානයෙන් වෙන් වී ඇති කොටස් ඇතුළුව, ගුවන් යානයේ ඕනෑම කොටසක් සමඟ සෘජුව ගැටීම ; හෝ
- ගුවන් යානයක් ගුවන්ගත වන විට හෝ ඊට පෙර ගුවන් යානාවල ජෙට් එන්ජින් මගින් නිපදවන වේගවත් වායු චලන සංසිද්ධියට සෘජුව නිරාවරණය වීම,

ස්වභාවික හේතුන් නිසා සිදු වූ තුවාල, ස්වයං-කරගත් හෝ වෙනත් පුද්ගලයින් විසින් සිදු කරන ලද තුවාල හෝ මගීන්ට සහ කාර්ය මණ්ඩලයට සාමාන්‍යයෙන් රැඳවී සිටිය හැකි ප්‍රදේශවලින් පිටත සැඟවී සිටින විට වූ තුවාල හැර; හෝ

b) ගුවන් යානයට හානියක් හෝ ව්‍යුහාත්මක අකර්මන්‍යවීමක් ඇති වීම:

- ගුවන් යානයේ ව්‍යුහාත්මක ශක්තිය, ක්‍රියාකාරීත්වය හෝ පියාසැරි ලක්ෂණ කෙරෙහි අහිතකර ලෙස බලපාන ලෙස, සහ
- සාමාන්‍යයෙන් බලපෑමට ලක් වූ සංරචකයේ විශාල අලුත්වැඩියාවක් හෝ ප්‍රතිස්ථාපනයක් අවශ්‍ය වන විට,

එනමුත් එන්ජිම ක්‍රියා විරහිත වීම හෝ හානි වීම, අදාළ හානි වීම එන්ජිමට, එහි කව්ලිංවලට හෝ උපාංගවලට සීමා වූ: හෝ අදාළ හානි වීම ප්‍රචාලකවලට, පියාපත් අගවලට, ඇන්ටනාවලට, ටයර්වලට, තිරිංගවලට, ගුවන් යානයක ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම සහ වැඩි කිරීමට එකතු කරන ලද බාහිර ව්‍යුහ වලට , ගුවන් යානයක ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම සහ වැඩි කිරීමට ගුවන් යානයේ මතුපිට පෘෂ්ඨයේ නිර්මාණය කරන ලද කුහර හෝ සිදුරුවලට සීමා වූ හානි සඳහා : හැර, හෝ

c) යානය අතුරුදහන් වී හෝ සම්පූර්ණයෙන්ම ප්‍රවේශ විය නොහැකි වූ විට;

**අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථාන:** හදිසි අවස්ථාවක් වාර්තා කරන පුද්ගලයෙකු සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හෝ මුදවා ගැනීම් උප මධ්‍යස්ථානයක් අතර තොරතුරු හුවමාරු කිරීම මගින් පහසුකම් සපයන ඕනෑම ඒකකයක්.

**අනතුරු ඇඟවීමේ අදියර:** ගුවන් යානයක සහ එහි ගමන් කරන්නන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානමක් පවතින තත්වයක්.

**ආපදා අවධිය:** ගුවන් යානයක් සහ එහි ගමන් කරන්නන්, බරපතල හා සිදු වීමට ඉතා ආසන්න අනතුරකින් තර්ජනයට ලක්ව ඇති බවට සාධාරණ නිශ්චිත භාවයක් ඇති අතර, ක්ෂණික ආධාර අවශ්‍ය වන තත්වයක්.

**ඩිචින්ග් (Ditching):** ගුවන් නියමුවාගේ පාලනයෙන් බැහැර සාධක යටතේ අනපේක්ෂිතව ජලය මත සිදු කරන ගොඩබෑමක්.

**හදිසි අදියර:** අවිනිශ්චිත අවධිය, අනතුරු ඇඟවීමේ අවධිය හෝ ආපදා අවධිය විය හැකි තේරුම දෙන පොදු පදයක්.

**සිද්ධිය:** හදිසි අනතුරක් හැර, මෙහෙයුමේ ආරක්ෂාවට බලපාන හෝ බලපෑ හැකි, ගුවන් යානයක ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ වෙනත් සිදුවීමක්.

**ක්‍රියාකරු (Operator):** ගුවන් යානා මෙහෙයුමක නියැලී සිටින හෝ ඒ සඳහා ඉදිරිපත් වන පුද්ගලයෙකු, ආයතනයක් හෝ ව්‍යවසායයක්.

**ප්‍රධාන නියමුවා:** ක්‍රියාකරු විසින් නියම කරන ලද නියමුවා, හෝ පොදු ගුවන්සේවා (General Aviation) සම්බන්ධයෙන්, අණ දෙන සහ ගුවන් ගමනක ආරක්ෂිතව හැසිරවීම සම්බන්ධ නිලධාරියා ලෙස, යානයේ හිමිකරු.

**මුදවා ගැනීම්:** විපතට පත් පුද්ගලයන් ප්‍රකෘති තත්වයට නැවත ගෙන ඒම සඳහා, ඔවුන්ට මූලික වෛද්‍ය හෝ වෙනත් අවශ්‍යතා සපයා දීම සහ ඔවුන් ආරක්ෂිත ස්ථානයකට භාරදීම සඳහා සිදු කරන මෙහෙයුමක්.

**සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය**: සෙවීම් සහ මුදවා ගැනීම් සේවාවන් කාර්යක්ෂමව සංවිධානය කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීම් කලාපයක් තුළ සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිව යුතු ඒකකයක්.

**සෙවීම් සහ මුදවා ගැනීමේ උප මධ්‍යස්ථානය:** වගකිවයුතු බලධාරීන්ගේ විශේෂිත විධිවිධානවලට අනුව, සෙවීම් සහ මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක සේවය අනුපූර්ණය කිරීම සඳහා පිහිටුවා ඇති, සෙවීම් සහ මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයකට යටත් වන ඒකකයක්.

**සෙවීම්:** පවතින පිරිස් සහ පහසුකම් යොදා ගනිමින්, සාමාන්‍යයෙන් සෙවීම් සහ මුදවා ගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හෝ සෙවීම් සහ මුදවා ගැනීම් උප මධ්‍යස්ථානයක් මගින් සම්බන්ධීකරණය කරන්නා වූ විපතට පත් පුද්ගලයින් සොයා ගැනීම සඳහා වූ මෙහෙයුමක්.

**සෙවීම් සහ මුදවා ගැනීමේ ගුවන් යානා:** සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා සුදුසු විශේෂිත උපකරණ සහිත ගුවන් යානයක්.

**සෙවීම් සහ මුදවා ගැනීම් පහසුකම:** සෙවීම් සහ මුදවා ගැනීම් මෙහෙයුම් සිදු කිරීමට භාවිතා කරන, නිශ්චය කරන ලද සෙවීම් සහ මුදවා ගැනීම් ඒකක ඇතුළු ඕනෑම ජංගම සම්පතක්.

**සෙවීම් සහ මුදවා ගැනීමේ සේවාව:** සහයෝගිතා ගුවන් යානා, යාත්‍රා සහ අනෙකුත් යානා සහ ස්ථාපන ඇතුළුව රාජ්‍ය සහ පෞද්ගලික වත්කම් හෝ සැපයුම් භාවිතය තුළින්, ආපදා නිරීක්ෂණ, සන්නිවේදනය, සම්බන්ධීකරණය සහ සෙවීම් සහ මුදවා ගැනීමේ කාර්යයන්, මූලික වෛද්‍ය ආධාර හෝ පහසුකම් සහිත ස්ථානයකට යොමු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම.

**සෙවීම් සහ මුදවා ගැනීම් කලාපය:** සෙවීම් සහ මුදවා ගැනීම් සේවා සපයන, මුදවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හා සම්බන්ධ, නිර්වචනය කළ මානයන් සහිත ප්‍රදේශයක්.

**සෙවීම් සහ මුදවා ගැනීම් ඒකකය:** සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම් කඩිනම් කිරීම සඳහා සුදුසු උපකරණ සපයා ඇති, පුහුණු පුද්ගලයින්ගෙන් සමන්විත ජංගම සම්පතක්.

**ලියාපදිංචි රාජ්‍යය:** ගුවන් යානය ලියාපදිංචි කර ඇති නිල ලේඛනය අයත් රාජ්‍යය.

**අවිනිශ්චිත අවධිය:** ගුවන් යානයක සහ එහි ගමන් කරන්නන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පවතින තත්වයක්.

EOG 08-0274

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.